# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.01.27

වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 27 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජනවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
13. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
14. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
18. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
19. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
02. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
03. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**01) 2020-12-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020-12-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2020-12-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2020-12-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ''42 පිටුව''

''මේ රෝගය බෝවෙනවා නම් කොරෝනා වගේම හොඳයි.'' මම මෙතනදී කියන්න ගියේ ව්‍යාපාර කරන කොට එකම ව්‍යාපාර වගේ දේවල් කරනවා. මම මේකෙදී කොරෝනා වගේ ඒක බෝවෙනවා නම් හොඳයි කියලා කිවුවේ නැහැ. ඒක ඇවිල්ලා තියෙන්නේ එහෙම. කොරෝනා වගේ බෝවෙන්නේ නැතුව, නමුත් මේ වගා ව්‍යාපාරය බෝවෙලා යනවා නම් හොඳයි කියන එක කිවුවේ. ඒක ඒ අයුරින් සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාර්තාවේ අඩුපාඩුකම් එච්චරයිනේ.

2020-12-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා මේ අවස්ථාව තමයි මේක මතක් කරන්න ඕන. සභාපතිතුමනි, නොසිතූ විදියට මේ සභාව දෙවරක් කල් දාන්න සිදු වුණා. ඒක ඉතිං නොවැළැක්විය හැකි දෙයක්. පුළුවන් තරම් දුරට බලන්න ඒ දින වෙන් කරලා තියෙනවා නම් ඒක එහෙම නොවෙන්න. විශේෂයෙන්ම සභාවේ නඩු පවතින දිනවලට කමිටු පවා දැමීමෙන් වළකින්න කියලා ඉල්ලනවා. ඒ දිනය බලලා කවදද තියෙන්නේ කියන එක අදාළ නිලධාරි මහතාගෙන් අහලා ඒක මේවා කරන්න කියලා ඉල්ලනවා. මේ පාර කමිටුවට අපිට එන්න පුළුවන්කම ලැබුණේ වෙලාව වෙනස් කරපු හින්දා. නැත්නම් එදා දවසේ නඩුවක් පැවතුණා.

<u>**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පහුගිය සතියේ 19 වෙනිදා තමයි මහා සභා රැස්වීම පවත්වන්න තිබුණේ. නමුත් අපිට ඒක කල් දාන්න සිද්ධ වුණා අපේ නිලධාරීන් 17 දෙනෙක් නිරෝධායනයට ලක් කරලා තිබුණ නිසා. ඊළඟට අපි ඒක 26 වෙනිදා තියා ගන්න සැලසුම් කරා. නමුත් එතනදී රමේෂ් පතිරණ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ජාතික උත්සවයක් තිබුණා හෝළුවාගොඩ. ඒ කටයුත්තේ වැඩ අවසන් වෙද්දි සම්පූර්ණයෙන්ම ඒක සභාවට භාර දෙන්න තමයි තීරණය කරලා තියෙන්නේ. ඉතිං ඒක හින්දා අපිට ඒකට සහභාගි වෙන්න තිබුණ නිසා ඊයේ රැස්වීම අද දක්වා කල් දැමුවා. ඉතිං ඒ පිළිබඳව සඳහන් කරනවා. හෝළුවාගොඩ ඉලක්ක කර ගනිමින් රමේෂ් පතිරණ ඇමතිතුමාගේ සම්පූර්ණ මැදිහත් වීමෙන්, එතුමාගේ නායකත්වයෙන් දියදම් උයන කියන ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. එතනදී ඒක අක්කර 13 ක භූමි භාගයක් පාරෙන් මෙහා පැත්තේ ඉදිකරනවා. ඒක ගැන මන්ත්‍රීවරු දැනුවත් කරන්න තමයි මම මේක කියන්නේ. පාරෙන් මේ පැත්ත, වම් පැත්ත වගා බිම තියෙනවා අනෙක් පැත්තේ සම්පූර්ණයෙන් අක්කර 13 ක් රජයට පවරාගැනීම කරලා අවසානයි. එතන වැවක්, ඇවිදින මංතීරුවක්, ළමයින්ට ක්‍රීඩා කරන්න පුළුවන් සෙල්ලම් පිට්ටනියක්, ඊට පස්සේ වාහන නැවතුම්පොළක්, කඩ කාමර 12 ක්, ආපනශාලාවක්, ඒ වගේ දෙයක් තමයි එතන කෙරෙන්නේ. ඉතිං ඒකට දැනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තමයි මුදල් වෙන් කරලා තියෙන්නේ. ඒකෙ වැඩ අවසන් වෙනකොට ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම කරන්න තමයි දැනට සාකච්ඡා කරලා තියෙන්නේ. ඒක සභාවේ වත්කමක් විදියට අපිට එකතු වෙනවා ඒ වැඩේ අවසානයේදී. ඒක පළවෙනි කාරණය.

ඊළඟට ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව පොඩි ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වෙලා තියෙනවා අප්ග්‍රාෆ්ට්, ඩවුන්ග්‍රාෆ්ට් කියන ක්‍රම දෙකෙන් මොකක්ද අපි කරන්නේ කියලා. අපි ඒ ආයතන දෙකම කැඳෙව්වා. ඒ ආයතන දෙකටම එන්න කියලා ආරාධනා කරා. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුතුමා කියන්නේ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට තමයි කරන්න ඕන, ඒ අය එකඟ නැහැ කියලා අප්ග්‍රාෆ්ට් ක්‍රමයට. නමුත් අපිට නර්ඩ් ආයතනය කියන්නේ එයාලා කරන්නේ අප්ග්‍රාෆ්ට් ක්‍රමයට කියලා. අපිට තේරුමක් නැහැ මොකක්ද මේ ක්‍රම දෙක කියලා. ඒක හින්දා මේ ගැන දැනුවත් කිරීමකට අපි ඒ දෙගොල්ලොන්ටම එන්න කියලා කිවුවා. නමුත් කලින් එනවා කියලා දැනුවත් කරලා තිබුණත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුතුමා, නමුත් දැන් ලේකම්තුමා සඳහන් කරා එතුමා සහභාගි වෙන්නේ නැහැ කියලා. නමුත් නර්ඩ් ආයතනයෙන් අද දැනුවත් කිරීමකට සහභාගි වෙනවා. ඉතිං එතනදී සභාව සතුයි ගන්නා වූ තීරණය. එතනදී අපි සාකච්ඡා කරලා මොකක්ද කරන ක්‍රමවේදය කියලා තීරණය කරමු එතුමා ආවට පස්සේ ඒ පැහැදිළි කිරීම බලලා. මේ වෙනකම් සියළු දේ අපි කරලා තියෙන්නේ. දැනට ටෙන්ඩර් කරන්න විතරයි අපිට තියෙන්නේ. ඇස්තමේන්තු පවා නර්ඩ් ආයතනයෙන් අපි ලබා ගෙන ඔක්කොම වැඩ කටයුතු අවසන් කරලා තියෙන්නේ.

ඒ වගේම කියන්න අමතක වුණා, අපේ ලියනගේ මන්ත්‍රීතුමාට සුභ උපන් දිනයක් කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ෆේස් බුක් එකේ එකවුන්ට් තුන හතරක් තියෙනවා නේ. මේ ඒවායින් එක දවසක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම රත්න ගමගේ මැතිතුමාගේ උපන් දිනයත් අද. එතුමාටත් අපි සුභ උපන් දිනයක් කියලා ප්‍රාර්ථනා කරනවා එතුමා නොසිටියත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, විනාඩියක් අදහස් දක්වන්න ඉඩ ලබා දෙන්න. ඇත්තටම වටිනා වැඩපිළිවෙලක් මේක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔය කතා කරන්න හදන්නේ ආදාහනාගාරය ගැනද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. දෙකම ගැන පොඩ්ඩක් කතා කරන්න හැදුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ පළවෙනි යෝජනාව තියෙන්නේ ඒක. ඒකත් එක්ක මේක ගැන කතා කරමු.

(ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** සිට්ටුස්වත්තේ ඉදිකිරීමට යෝජිත අදාහනාගාරය සඳහා උපදේශන සේවාව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERD) හරහා ලබා ගැනීමටත්, එම ආයතනය මගින් සකස්කරනු ලබන සැලසුම් සහ ඇස්තමේන්තු අනුව ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමටත්, මේ සඳහා උපදේශන සහ වෙනත් සේවා ගාස්තු සභා අරමුදලෙන් ගෙවීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ආයතනයෙන් මේ ගැන දැනුවත් කිරීමට අද පැමිණෙනවා. නමුත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපි ඉල්ලලා යැව්වා මේ පිළිබඳව ඒ අයගේ මතය මොකක්ද කියලා. ඒ අය එවලා තියෙනවා මේකට උත්තරයක්. මේකට අදාළ ඇස්තමේන්තු අපි යැවුවා පළාත් පාලන දෙපාර්තමේන්තුවට. ඒ අයගේ ඇස්තමේන්තුවක් නෙමෙයි හැබැයි එවලා තියෙන්නේ. ඒ අය අපි යවපු ඇස්තමේන්තුවෙන් පෙන්වනවා ඊට වඩා අඩුවෙන් කරන්න පුළුවන් කියන එක. නමුත් මූලික ගැටළුව තියෙන්නේ මෙතන මට මේ ඉදිකිරීම පිළිබඳව නෙමෙයි. ක්‍රම දෙකෙන් මොකක්ද අපිට ගැලපෙන ක්‍රමය කියලා මට ගැටළුව තියෙන්නේ. මම මේ සම්බන්ධව ගාල්ල නගරාධිපතිතුමාට කතා කරලා ඇහුවා. එහෙත් කාලයක් තිස්සේ මේක තියෙනවානේ. එතුමා ඉන්න ස්ථාවරය නම් අපිට ප්‍රශ්නයක් ඇති වුණාම වග කියන්න තැනක් තියෙන්න ඕන කියලා. නර්ඩ් ආයතනය සම්බන්ධ කරගෙන යන්න කියලා එතුමා කිව්වේ. මොකද, අධිකරණයකට ගියත් ප්‍රශ්නයකදී ඉදිරිපත් වෙන්න පුළුවන් ආයතනයක් තමයි ඒ ආයතනය. අපි නර්ඩ් තාක්ෂණය ගන්නේ නැත්නම් අපිට ඒ ආයතනය ප්‍රශ්නයකදී සම්බන්ධ කරගන්න බැහැ. ඒක තමයි නගරාධිපතිතුමා නම් දරපු මතය. ඉතිං ඔය ප්‍රශ්නය තියෙනවා. අපිට පළාත් පාලන දෙපාර්තමේන්තුව අත ඇරලා වැඩ කරන්නත් බැහැ.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා නර්ඩ් එකෙන් කරන්න කියන්නේ මොන ක්‍රමයද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙම ප්‍රශ්නයකුත් තියෙනවා. නර්ඩ් ආයතනයේ ඇස්තමේන්තුවේ සඳහන් නැහැ වාහන නැවතුම්පොළ, මාර්ග පද්ධතිය, කාණු පද්ධතිය, ආරක්ෂක කුටි ඉදිකිරීම සහ වැසිකිළි පහසුකම් සම්බන්ධව. ඒවා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් යෝජනා කරලා තියෙනවා. ආබාධිත අයට යන්න පුළුවන් වැසිකිළියක් පවා ඒකෙ තියෙනවා. මේ ටික නර්ඩ් එකෙන් එවපු ඇස්තමේන්තුවේ සඳහන් නැහැ. ඒකට ලක්ෂ 85 ක් වෙනම දාලා තියෙනවා පළාත් පාලන

දෙපාර්තමේන්තුවෙන්. ඉතිං ඔය වගේ ගැටළු කිහිපයක් තියෙනවා ඉදිකිරීම සම්බන්ධව. නමුත් මට තියෙන ප්‍රශ්නය තාක්ෂණය පිළිබඳව මොකක්ද අපි දරන්න ඕන මතය කියන එක. ඒක ගැන දැනුවත් කරන්න නර්ඩ් ආයතනයෙන් අද එනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවපු ලියුම ගැනනේ දැන් කතා කරේ. ඒකෙ චිම්නිය සම්බන්ධව අපි ඉල්ලීම කරේ නර්ඩ් ආයතනයෙන් චිම්නි දෙකක එකක් නේද.

(ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගී වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ද්විත්ව කුටීර එකක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** හැබැයි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවපු එකේ දෙකක් කියලා සඳහන් වෙන්නේ නැහැ. මුදල අඩු වුණාට ඒකත් පැහැදිළි කර ගන්න. තනි එකටද දන්නේ නැහැ ඕක එවලා තියෙන්නේ. අරක නම් අපි දන්නවා කෙලින්ම දෙකකට කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවපු එකේ තියෙන්නේ දළ ඇස්තමේන්තුවක්. සමහරවිට මේක හරියට හදන කොට අර ඇස්තමේන්තුවට කිට්ටු වෙන්නත් පුළුවන්. ඒක අපිට කියන්න බැහැ. මට තියෙන ගැටළුව ඒක නෙමෙයි. මට තියෙන ගැටළුව පළාත් පාලන දෙපාර්තමේන්තුව බොහොම හෙමින් මේක කරන්නේ.

නර්ඩ් ආයතනයේ ඉංජිනේරු උදය පරණවිතාන මහතා මගේ ආරාධනාව පිළිඅරගෙන මේ අවස්ථාවට කොළඹ සිට දැන් සම්බන්ධ වෙනවා. අද අපි ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව තීරණයක් ගත යුතුයි. අපි සඳහන් කරමින් හිටියේ මේකෙදී තාක්ෂණය පිළිබඳ දැනුමක් අපිට නැහැ. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපිට නිර්දේශ කරන්නේ ඩවුන්ග්‍රාෆ්ට් කියන ක්‍රමය. මෙතුමන්ලා අපිට නිර්දේශ කරන්නේ අප්ග්‍රාෆ්ට් කියන ක්‍රමය. ඇත්තටම මේක ගැන හරි දැනුමක් නැහැ මේ කාටවත්. මටවත්, මේ මන්ත්‍රීවරුන්ටවත් ඒ දැනුම නැහැ. මේ වැඩේ දවසෙන් දෙකෙන් කරලා ඉවර කරන්න පුළුවන් වැඩක් නෙමෙයි. මේක ජීවිත කාලය දක්වාම කරන වැඩක්. මේ වැඩේ කරලා අපි නැති කාලයක හරි වෙන කෙනෙකුට ගැටළුවකට මුහුණ දෙන්න වෙනවා නම් ඒක හොඳ නැහැ. මේකට විශාල මුදලක් වැය වෙනවා. ඒක හින්දා අපි රාජ්‍ය ආයතනයක් විදියට ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා මේ දෙකෙන් හරි දේ අපිට කියන්න කියලා. මේකෙන් හරි දේ තෝර ගන්න අපිව යොමු කරන්න කියලා තමයි අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ. ඔබතුමන්ලාගේ ආයතනය අවුරුදු ගාණක් තිස්සේ මේ සම්බන්ධව ඉන්න ප්‍රධානම රාජ්‍ය ආයතනය. මම හිතන්නේ එකම රාජ්‍ය ආයතනය. ඉතිං එතනදී අපි ගන්න ඕන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා තාක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම තමයි ප්‍රධාන වශයෙන් වැදගත් වෙන්නේ. මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. මන්ත්‍රීවරුන්ට එතුමාගෙන් අහලා තියෙන ප්‍රශ්න කතා කරගමු විවෘතව.

මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් නර්ඩ් ආයතනයේ ඉංජිනේරු උදය පරණවිතාන මහතාට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී නර්ඩ් ආයතනයේ ඉංජිනේරු උදය පරණවිතාන මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ❖ නර්ඩ් ආයතනය රාජ්‍ය ආයතනයක් බවත්, ලංකාවේ වැඩිම ආදාහනාගාර සංඛ්‍යාව ඉදිකිරීම සහ නිරීක්ෂණය කිරීමේ කටයුතු සහ අවශ්‍ය වන්නා වූ සියළුම වාර්තාවල් සකස් කිරීමේ කටයුතු මෙම ආයතනය හරහා සිදු කරන බව.
- ❖ නර්ඩ් ආයතනය විසින් ලබා දෙන නිර්දේශ අධිකරණය විසින්ද පිළිගන්නා බව.
- ❖ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට ඉදිකරනු ලබන ආදාහනාගාර සඳහා නර්ඩ් ආයතනය විසින් නිර්දේශ කිරීමේ කටයුතු සිදු කළද, ඒ සඳහා කිසිදු ආකාරයක වගකීමක් භාර නොගන්නා බව.
- ❖ දැනට තිබෙන නවීනතම තාක්ෂණය උපයෝගි කරගෙන ඉදිකරන්නා වූ චෙම්බර් දෙකක් සහිත ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති බව.
- ❖ එම ආදාහනාගාරය පරිසර හිතකාමී ලෙස සකස් කර ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරියද, ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇති බව.
- ❖ නර්ඩ් ආයතනයේ වගකීම සහ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ආදාහනාගාරයේ ඉදිකිරීමේ කටයුතු සිදු කරන බව.

- ❖ නර්ඩ් ආයතනයේ බලපත්‍රලාභී ආදාහනාගාර ඉදිකිරීමේ ආයතන අටක් දැනට ලංකාවේ ඇති බවත්, එම ආයතන හරහා මෙම ආදාහනාගාරය ඉදිකිරීම සිදු කරනු ලබන්නේ නම් නර්ඩ් ආයතනයේ අධීක්ෂණය යටතේ මෙම ඉදිකිරීමේ කටයුතු සිදු කරන බව.
- ❖ ගාල්ල මහා නගර සභාවේ ඇති ආදාහනාගාරය ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට නිර්මාණය කර ඇති අතර, ඒ සඳහා එංගලන්තයෙන් ආනයනය කරන ලද උසස් තත්ත්වයේ උපාංග භාවිතා කර ඇති බවත්, දැනට එම උපාංග වෙළඳපොලෙන් මිලදී ගැනීමට නොමැති බව.
- ❖ ඩවුන්ග්‍රාෆ්ට් තාක්ෂණය යටතේ ලංකාවේ නිෂ්පාදිත උපාංග ආදාහනාගාර ඉදිකිරීම සඳහා භාවිතා කරන බවත්, මේ නිසා ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ නිසි ප්‍රමිතියෙන් යුතු ආදාහනාගාර ලංකාවේ ඉදිනොවන බව.
- ❖ අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති ආදාහනාගාරයේ දුම පිටවීම අවම මට්ටමක පවතින බවත්, එහිදී කුටීර දෙකකදී ආදාහනය සිදු වන බව.
- ❖ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයේදී දුම යටට උරා ගෙන නැවත උඩට ලබා දෙන බවත්, නර්ඩ් ආයතනය විසින් අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ඉදිකරනු ලබන ආදාහනාගාරවල දුම කෙලින්ම චිම්නිය දිගේ පිට වෙන බවත්, උඩට ඇදී එන දුම නැවතත් උඩ ඇති කුටීරයෙන් ආදාහනය කිරීමෙන් පසු බාහිර පරිසරය වෙත දුම පිටකරන බවත්, එම නිසා බාහිර පරිසරය වෙත අළු නිකුත්වීම අවම මට්ටමකින් පවතින නිසා එය පරිසර හිතකාමී බව.
- ❖ බර්නර් භාවිතා කොට මෙම ආදාහනාගාරවල ආදාහන කටයුතු සිදු කරන බව.
- ❖ ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට ලංකාව තුළ ඉදිකරනු ලබන ආදාහනාගාර සඳහා ප්‍රමිති සහතික නිකුත් කිරීමට හැකියාව ඇති ආයතනයක් නොමැති බවත්, අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ඉදිකරනු ලබන ආදාහනාගාර සඳහා නර්ඩ් ආයතනයට ප්‍රමිති සහතික නිකුත් කල හැකි බව සහ එම ප්‍රමිති සහතික අධිකරණය විසින්ද පිළිගනු ලබන බව.
- ❖ නර්ඩ් ආයතනයේ තාක්ෂණය උපයෝගී කර ගෙන සහ එම ආයතනයේ අධීක්ෂණය යටතේ ඉදිකරනු ලබන ආදාහනාගාර සඳහා ඉදිරියේදී පැන නගින පාරිසරික ගැටළු සම්බන්ධව අධිකරණය ඉදිරියේ පෙනී සිටින බව.
- ❖ අධිකරණය විසින්ද ආදාහනාගාර සම්බන්ධව පැන නගින ගැටළු සඳහා නිර්දේශ ලබා ගන්නේ නර්ඩ් ආයතනය හරහා බවත්, මේ සඳහා උදාහරණ ඉදිරිපත් කළ හැකි බව.
- ❖ ආදාහනාගාර සඳහා නවීකරණ කටයුතු සිදු කරන්නේ නම් නර්ඩ් ආයතනය ඒවා යෝජනා කරන බවත්, ඒ සඳහා නර්ඩ් ආයතනය හරහා වැඩිදුර විස්තර සහ වාර්තා ලබා ගත හැකි බවත්, අධිකරණය විසින් එම වාර්තාවන් පිළිගන්නා බව.
- ❖ නර්ඩ් ආයතනය සතුව මෙම ක්‍රම දෙක යටතේම ආදාහනාගාර ඉදිකිරීම සඳහා දැනුම ඇති බවත්, නමුත් ආදාහනාගාර ඉදිකිරීමේදී ප්‍රමිති සහතිකයක් නිකුත් කළ හැක්කේ අප්ග්‍රාෆ්ට් ක්‍රමයට පමණක් බව.
- ❖ නර්ඩ් ආයතනය විසින් සකස් කරනු ලබන ඇස්තමේන්තු සඳහා වගකීමක් ඇති බවත්, ඒවා රජය පිළිගත් ඇස්තමේන්තු බව.
- ❖ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවේ මුදල විශාල අගයක් ගනු ලැබුවද, අනාගතයට ගැලපෙන ලෙස සහ පරිසර හිතකාමී ලෙස නවීන තාක්ෂණය යොදාගනු ලබන චෙම්බර් දෙකකින් සමන්විත ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇති බව.
- ❖ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව ආදාහනාගාර දෙකක් ඉදිකරන බව, ද්විත්ව කුටීරයකින් සමන්විත ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා සැලැස්ම ඉදිරිපත් කර ඇති බව.
- ❖ ගාල්ල මහා නගර සභාව විසින් දඩල්ලේ ඉදිකර ඇති ආදාහනාගාරයේ අළුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු කිරීමේ කටයුතු නර්ඩ් ආයතනය හරහා සිදු කරන බව.
- ❖ නර්ඩ් ආයතනයේ තාක්ෂණය උපයෝගි කර නොගෙන ඉදිකරනු ලබන ආදාහනාගාර සඳහා ඉදිරි අළුත්වැඩියා කටයුතු වලදී නිර්දේශ ලබා දීම නර්ඩ් ආයතනය සිදු නොකරන බව.
- ❖ හබරාදූව, තිස්සමහාරාමය, බෙලිඅත්ත, අම්බලන්තොට යන ප්‍රාදේශීය සභා වල ආදාහනාගාරද ඉදිකරන ලද්දේ නර්ඩ් ආයතනයේ අධීක්ෂණය යටතේ බව.
- ❖ පරිසරයට 100% ක් පූර්ණ දහනයකින් පසු දුම පිට නොකරන බවත්, උෂ්ණත්වය සෙල්සියස් අංශක 1000 ට වැඩි වූ විට සියළුම අපද්‍රව්‍ය විනාශ වන බවත්, උෂ්ණත්වය සෙල්සියස් අංශක 1200 ට ආදාහනය කළ පසු බාහිර පරිසරයට අවම මට්ටමෙන් දුම පිටවන බව.
- ❖ යෝජනා කර ඇති ආදාහනාගාරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 1200 ට ළඟා වන බැවින්, බාහිර පරිසරයට කිසිදු ගැටළුවක් ඇති නොවන බව.
- ❖ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමයට වඩා නවීන තාක්ෂණය උපයෝගී කර ගෙන අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මෙම ආදාහනාගාරය ඉදිකිරීම සඳහා නර්ඩ් ආයතනය විසින් සැලසුම් ඉදිරිපත් කර ඇති බව.
- ❖ ලංකාවේ දැනට තිබෙන උසස්ම තාක්ෂණය භාවිතා කර ඇති ආදාහනාගාරය කොළඹ මහා නගර සභාව විසින් නඩත්තු කරනු ලබන බොරැල්ල කනත්තේ ඉදිකර ඇති ආදාහනාගාරය බවත්, එහි ඉදිකර ඇති ද්විත්ව ආදාහනාගාර කුටීරයේ මිල රුපියල් මිලියන 60 ක් වන බව.

- ❖ නර්ඩ් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති සැලැස්මේ වැසිකිළි, ගොඩනැගිලි අත්තිවාරම සහ බිම් සැකසීම ආදියද ඇතුළත් කර ඇති බව.
- ❖ ආදාහනාගාරය ඉදිකරනු ලබන භූමිය වටා වැට ඉදිකිරීමට අදාළව පිරිවැය මෙම ඇස්තමේන්තුවට ඇතුළත් කර නොමැති බව සහ බැමි ඉදිකිරීමට අදාළ පිරිවැය ඇතුළත් කර නොමැති බව. ඒවා අදාළ පළාත් පාලන ආයතනය මගින් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කර ගන්නා බව.
- ❖ අවුරුදු 25 ක 30 ක කාලසීමාවක් ඔස්සේ ආදාහනාගාර ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති ආයතන අටක් නර්ඩ් ආයතනයේ ලියාපදිංචි වී ඇති බව හා එම ආයතන හරහා ආදාහනාගාරය ඉදිකිරීමෙන් අනාගතයේදී පරිසර ප්‍රශ්න ඇති නොවන බව.
- ❖ ආදාහනාගාරය ඉදිකිරීමෙන් පසු සේවාවන් ලබා ගැනීම සඳහාද, නර්ඩ් ආයතනය හරහා ඇස්තමේන්තු ලබා ගෙන ඒ අදාළ ක්‍රියාවලීන්ට අනුව අදාළ සේවාවන් ඉටු කර ගත හැකි බව.
- ❖ ඉදිකිරීමෙන් පසු ලක්ෂ පහට වැඩි අළුත්වැඩියාවන් වලට අදාළ ඇස්තමේන්තු නර්ඩ් ආයතනය හරහා ලබා ගෙන විවෘත ටෙන්ඩර් කැඳවා අදාළ අළුත්වැඩියාවන් සිදු කර ගත හැකි බව.
- ❖ ආදාහනයක් සිදු කරන විට ආරම්භක උෂ්ණත්වය සෙල්සියස් අංශක 400 සිට 600 අතර ඇති බවත්, ක්‍රම ක්‍රමයෙන් එම උෂ්ණත්වය වැඩි කර ගන්නා බවත්. ආදාහනාගාරයේ උඩ ඇති බර්නර් එක මුලින්ම ක්‍රියාත්මක කර ආදාහනාගාරයේ කටයුතු සිදු කරන බව.
- ❖ ආදාහනාගාරයේ හදිසි අක්‍රියවීම් වලදී අළුත්වැඩියා කටයුතු සඳහා නර්ඩ් ආයතනයේ ලියාපදිංචි සේවා දායක ආයතනයක් සමඟ සේවා ගිවිසුමකට බැඳීමට හැකියාව ඇති බවත්, ඊට අමතරව නර්ඩ් ආයතනය හරහාද, එම සේවා කිරීමේ කටයුතු සිදු කළ හැකි බව.
- ❖ වගකීම් කාලය ඇතුළත සිදු කරනු ලබන අළුත්වැඩියාවන් කටයුතු සඳහා අදාළ ඉදිකිරීමේ ආයතනය වගකියන බවත්, වගකීම් කාලයෙන් පසුව සිදු කරනු ලබන අළුත්වැඩියාවන් කටයුතු සඳහා ගාස්තු ගෙවිය යුතු බව.
- ❖ යුරෝපයෙන් ආනයනය කරනු ලබන බර්නර් යොදා ගෙන මෙම ආදාහනාගාරය ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති බවත්, ඒවායේ අමතර කොටස් ගෙන්වනු ලබන ඒජන්තවරු ලංකාවේ සිටින බව.
- ❖ නර්ඩ් ආයතනයේ බලපත්‍රලාභී ආයතනයක් විසින් ආදාහනාගාරය ඉදිකිරීමේදී අධීක්ෂණය කළ යුතු අදියර වලදී පමණක් ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහා නර්ඩ් ආයතනය සහභාගි වන බව.
- ❖ නර්ඩ් ආයතනයේ තාක්ෂණය උපයෝගී කර ගෙන කසළ දාහක යන්ත්‍රද, ඉදිකරන බවත්, එහි ධාරිතාවය අනුව මිල ගණන් වෙනස් වන බව.
- ❖ පැයට කසළ කිලෝ 100 ක් දහනය කළ හැකි දාහකයෙන් පැය 24 පුරාවටම කසළ දහනය කළ හැකි බවත්, රෝහල්වල ඉදිකර ඇති දාහක යන්ත්‍රද පැය 24 පුරාවටම ක්‍රියාත්මක වන බව.
- ❖ 30% ක් දක්වා ජලය ඇති කසළ දහනය කළ හැකි ආකාරයට මෙම කසළ දාහකය නිර්මාණය කර ඇති බව.
- ❖ සම්පූර්ණයෙන්ම ප්ලාස්ටික් පමණක් දහනය කිරීමට ඉඩ ලබා දෙන බවත් නමුත් පී.වී.සී. බට දහනය කිරීම සඳහා ඉඩ ලබා නොදෙන බවත්, කසළ දාහක යන්ත්‍ර වලද උෂ්ණත්වය සෙල්සියස් අංශක 1200 ට ළඟා වන බව.
- ❖ දැනට හොරණ ප්‍රාදේශීය සභාව මගින් පැයකට කසළ කිලෝ 100 ක් දහනය කළ හැකි කසළ දාහකයක් ඉදිකරන බවත්, ඒ සඳහා රුපියල් මිලියන 9 කට ආසන්න මුදලක් වැය වන බව.
- ❖ දවසකට ටොන් පහක් දහනය කළ හැකි කසළ දාහකයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 30 කට පමණ ආසන්න මුදලක් වැය වන බව.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය කාරක සභා අවස්ථාව ක්‍රියාත්මක වන විට සභාවට සහභාගි වීම සිදු විය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම ඇත්තටම නර්ඩ් ආයතනයේ ඉංජිනේරු උදය මහතාට ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, මගේ දුරකථන ඇමතුමකින් කරන ලද ආරාධනය පිළිඅරගෙන මෙතුමා මේ අවස්ථාවට සහභාගි වීම පිළිබඳව. මේ කාලයත් එතරම් හොඳ කාලයක් නෙමෙයි. නමුත් එතුමා දන්නවා මම දිගින් දිගටම මේ පිළිබඳව එතුමාගෙන් විමසන බව. මට ලොකු මානසික පීඩනයක් මේ සම්බන්ධව තියෙනවා. මේ කරන දේට අපෙන් පස්සේ චෝදනාවට ලක් නොවෙන්න කරන්න ඕන. අපේ කාලයේදී නම් මොන ක්‍රමයට කරත් කමක් නැහැ. මේ අවුරුදු දෙක තුනෙන් පස්සෙත් මේකට දීර්ඝකාලීන විසඳුමක් තියෙන්න ඕන. මෙතුමාගේ ඉදිරිපත් කිරීම පිළිබඳව අපි සෑහීමකට පත් වෙනවා.

ඇත්තටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපිට අවශ්‍ය වන්නේ ආදාහනාගාරය ඉදිකිරීමෙන් පසු සේවා සැපයීමයි. ඒකට අපි ඔබතුමන්ලාගේ ආයතනයේ ලියාපදිංචි ආයතනයක් හරහා මේ කටයුත්ත කඩිනමින් නිම කරන්න බලාපොරොත්තු වෙනවා. මම ඉතාමත්ව ස්තුතිවන්ත වෙනවා ඔබතුමන්ට මේ අවස්ථාවට සහභාගි වෙලා අපිට දක්වපු සහයෝගය පිළිබඳව. පසුගිය වතාවේදී ඔබතුමන්ලා මැදිහත් වෙලා අපිට ඇස්තමේන්තුව ඉතා ඉක්මනින් සකස් කරලා දුන්නා. ඊට පස්සේ සේවා ගාස්තුව විදියට අපේ සභාවෙන් රුපියල් ලක්ෂ නමයක මුදලක් ඉල්ලුවා. අපි සභාවෙන් ඒක ගෙවන්න අනුමත කරා. ඒකටත් මම මෙතුමන්ලාගෙන් නැවත කරපු ඉල්ලීම අනුව ඒක රුපියල් හැත්තෑ දහසක් දක්වා අඩු කරා. ඒ පිළිබඳවත් ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. අපි ඒ රුපියල් ලක්ෂ නමයක මුදල පවා සභාවෙන් ගෙවන්න අනුමත කරා. ඒ මුදල අඩු කර ගන්න දක්වපු සහයෝගයටත් ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම ඉදිරියේදී ඔබතුමන්ලගේ නිරීක්ෂණ ගාස්තුත් අපි ප්‍රවාහන පහසුකම් සපයලා හරි වෙන මොකක් හරි ක්‍රමයකට හරි පුළුවන් නම් ඒ පිළිබඳව සලකා බලලා අපිට සහනයක් ලබා දෙන්න ඒ මුදලෙත් ප්‍රමාණය අඩු කරලා. ඒකත් සහනදායි මට්ටමට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. අපි දන්නවා කොළඹ ඉඳන් එන කොට ඒ මුදල ඔබතුමන්ලාට ගෙවන්න කියලා ඉදිරිපත් කරනවා. ඒකට ඔබතුමන්ලාට යම් මුදලක් වැය වෙනවා. අපිත් මහජනතාවට සේවය කරන ආයතනයක්. ඔබතුමන්ලාගේ ආයතනය රජයේ ආයතනයක් විදියට ඉදිරියේදී අපිට කතාබහ කරලා මේ පිළිබඳව දැනුම් දෙන්න. ඉදිරියට මේ කටයුත්ත සාර්ථක කර ගන්න අපි ඔබතුමන්ලගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා අද ඇවිල්ලා මේ අවුරුද්දේ අපේ පළවෙනි මහා සභා රැස්වීමේදී දක්වපු සහයෝගය පිළිබඳව සහ මන්ත්‍රීවරුන්ව මේ පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධව සභාපතිතුමා විදියට සහ උප සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයේ මෙන්ම ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලයේ ස්තුතිය ඔබතුමාට මේ අවස්ථාවේදී පුද කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම යෝජනාවක් ගෙනාවා ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව අපිට පහදලා දෙන්න කියලා මේ අදහස් තේරුම් ගන්න. ඇත්තටම දැන් පරිසර අනුකූලතාවය ගැන අපිට පැහැදිළියි. අපි යන්න ඕන ගල් යුගයට නෙමෙයි. හොඳ නවීන තාක්ෂණය සමඟ අපි ඉදිරියට යා යුතුයි. මුදල ගැන හිතනවාට වඩා තාක්ෂණය ගැන හිතන්න ඕන. මම යෝජනා කරනවා අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේක හදන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ නර්ඩ් ආයතනය ඉදිරිපත් කරපු සැලසුම පිළිඅරගෙන ප්‍රසිද්ධ දැන්වීම් පුවත්පත් වල පළ කරලා විවෘත ටෙන්ඩර් එකක් අනුව මේ කටයුත්ත සිදු කරන්න ඒකමතිකව මහා සභාවේදී තීන්දු වෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** සිට්ට්‍රස්වත්තේ අදාහනාගාරය ඉදිකිරීමට යෝජිත පර්චස් අසූවක බිම් ප්‍රමාණය පළාත් පාලන අමාත්‍යංශය, වැවිලි අමාත්‍යංශය සහ වතු සමාගම විසින් අප ප්‍රාදේශීය සභාව වෙත ලබා දීමට එකඟතාවය පළකොට ඇති බැවින් එම ඉඩම අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙන් නීත්‍යානුකූලව පවරන තෙක් සිට්ට්‍රස්වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා සභා අරමුදලෙන් වියදම් දැරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අනුමැතිය අපිට ලැබිලා තියෙනවා. ප්‍රාදේශීය ලේකම් අපිට ඉඩම පවරලා තියෙන්නේ. නමුත් ඒකෙ නැවත අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියකටත් නැවත ඒ අය යනවා කිවුවා. අපිට වැඩේ කරන්න අවශ්‍ය නෛතික පසුබිම දීලා තියෙනවා. ඒක ලිඛිතව අපිට ලබා දීලා තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, හෝළුවාගොඩ වෙල් යායේ ඒ වැඩේ කරන එක වටිනා වැඩක්. දැන් වැව හැදීම පිළිබඳව තාක්ෂණ නිලධාරීන් ඔක්කොම සම්බන්ධ වෙන්න ඇති. දැන් ඒක හදන්නේ පාරෙන් යට පැත්තේනේ. ඇත්තටම ඒකට කාගේවත් අදහසක් ආවේ නැද්ද පාරෙන් උඩ පැත්තේ හදන්න කියලා. මොකද වතුර පාර බහිනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මේක ඔබතුමන්ලට කියන්න ඕන. මේක ඇත්තටම ජල ගැල්ම පාලනය කරන්න හදන එකක් නෙමෙයි. මේකෙන් ජල ගැල්ම අඩු කිරීමක් වෙනවා. නමුත් ඔබතුමා දන්නවා දියත උයන ගැන. ඒක දැනටත් යට වෙනවා. මේකෙන් අබේසේකර මන්ත්‍රීතුමා ජලයෙන් යටවීම 100% ක් පාලනය වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කිවුවේ ඔතන නරකයි කියන කතාව නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සියළු ආයතන වල අධ්‍යයනයෙන් පසුව තමයි ඕක තීන්දු කරලා තියෙන්නේ. සියළුම ආයතන සම්බන්ධ වුණා ඕකට. ඕක අද ඊයේ කරපු දෙයක් නෙමෙයි. ඇමතිතුමා අවුරුදු දෙකක වගේ කාලයක ඉඳන් මේකෙ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ නිරත වුණා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුරුවත් ගොවියෙක්වත් ඕක ගැන අදහස් දැක්වූයේ නැද්ද. උඩ පැත්තේ කරොත් ගොඩක් වතුර රඳවා ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ පළවෙනි අදියර මෙහෙම යනවා. දෙවෙනි අදියරේදී එහා පැත්තෙන්, හෝළුවාගොඩ පාලම ළඟින් මේක වෙනම පාලනය වෙන්න වැඩපිළිවෙලක් තියෙනවා. මේක හදලා අර පැත්තෙන් වතුර බැස්සවීම පාලනය වෙනකොට මේක හරියනවා. මොකද ඒකට ක්‍රමවේද කිහිපයක් තියෙනවා අබේසේකර මන්ත්‍රීතුමා. ඇත්තටම අපි දැන් මෝය කට කපන්නේ වහිනකොට. ඒක තේරුමක් නැහැ. වැස්ස එන්න කලින් මෝය කට කපලා තියෙනකොට ඒ වතුර ටික බහිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකෙ වැටිය පිළිබඳව මම පැහැදිළි මතයක් දරනවා. මේ ඉංජිනේරුවෝ කොච්චර කිව්වත් අහන්නේ නැහැ. ඕපාත ගමේ ඉන්න පාලිත වගේ කට්ටිය අත්දැකීම් තියෙන මිනිස්සු. ගල් යටින් වතුර ගියාට පස්සේ වැඩක් නැහැ අර ගල් වැටිය දැමීමෙන්. ඒ හින්දා අර ගඟ කෙලින් කරන්න ඕන. එතන වෙලා තියෙන ප්‍රශ්නය වෙන්නේ හෝටල් අරවා මේවා හදලා අත්පත් කර ගෙන ඉන්න මිනිස්සුන්ගේ විරෝධතාවයක් තියෙන්නේ. ඒවා පෙන්වලා දෙන්න.

ඊළඟට සභාපතිතුමනි, ආදාහනාගාරය ඉදිකරන එක දැන් කෙරෙන දෙයක්. එතකොට ඇත්තටම දැන් ඒකෙ වාහන දෙකක් මාරු වෙන්න පුළුවන් විදියට දැන්ම ඒ පාර නිර්මාණය කර ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බේ දෙකක්වත් තියෙන්න ඕන තමයි. ඒක කර ගන්න ඕන.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** පෝද්දල පන්නමග මාර්ගය මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ වගේම සභාපතිතුමා අපේ ප්‍රදේශවලත් තියෙනවා මේ වගේ මායිම් ප්‍රශ්න. පාරේ කාපට් එකටම තාප්පය බැඳලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඒකට මම ඔබතුමාට විරුද්ධ මතයක් නෙමෙයි කියන්නේ. මගෙන් මාර්ග සංවර්ධන අධිකාරිය පවා ඉල්ලීමක් කරා ඒකට එකඟතාවයක් ලබා දෙන්න කියලා. ඒකට හේතුව මාර්ග සංවර්ධන අධිකාරිය මැදිහත් වෙලා අඩි 03 ක් 04 ක් විතර පාරට ලබා ගත්තා. පාර එහා පැත්තට ශිෆ්ට් කරා. ඒක කරන කොට මාර්ග සංවර්ධන අධිකාරිය කියලා තියෙනවා මේකෙදි ගැටළුවක් ඇති නොවෙන්න ඒ අය මැදිහත් වෙන්නම් කියලා. මම ඊයේ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයාට ඒ සම්බන්ධව කතා කරා. එතුමා කියන්නේ ඒ මිනිස්සු විතරයි ඒකෙදී ඉඩ දුන්නේ කියන එක. අපි පොඩ්ඩක් හරි ඒක එහාට කර ගන්න බලමු ප්‍රියන්ත මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක හැමෝම කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ ගැටළුව තියෙන්නේ ඒ පැත්තේ නෙමෙයි අනෙක් පැත්තේ. අනිත් පැත්තේ කණ්ඩිය පාර අයිනටම කැපීම නිසා තමයි දැන් මේ පැත්තේ මිනිස්සුන්ගෙන් පාරට ඉඩ ගන්න වෙලා තියෙන්නේ. ඒකයි වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක වෙන්න ඇති. නමුත් කාපට් එකටම නොදා තව ටිකක් ඉඩ තිබ්බා නම් හරි. මම කිව්වේ ඒක උදාහරණයට ගත්තම සියල්ල කරලා තියෙන්නේ වැරදියට. මේ වගේ ප්‍රශ්න මාර්ග වල තියෙනවා. ඒ නිසා සීමා ලකුණු කරනවා නම් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව දැම්මට ඉල්ලීමක් කරා ඒ අයගේ වියදමෙන් මිනින්දෝරුවෙක් යොදවන්නම් කියලා. මේකට සභාවෙන් වියදම් කරන්න ඕන නැහැ. ඒ අය මිනින්දෝරුවෙක් දාලා මනිනවා. අපිට ලිඛිතව දන්වන්න කියලා කිව්වා මම. අපිට මායිම් දාන කොට යන්න අවශ්‍ය වෙනවා. තාක්ෂණ නිලධාරීන් ඒකට සම්බන්ධ කරන්න ඕන. එතකොට සභාවෙන් මුදලක් යන්නේ නැහැ ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කලේගාන පොළ වක්වැල්ල ප්‍රදේශයට ගෙනයන තෙක් ආදායම් පරීක්ෂක මහත්වරුන් යොදවා පොළ කාසි එකතු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ වගේම මේකට කොටසක් එකතු කරන්න කැමතියි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා පහුගිය දවසේ මා සමග ප්‍රකාශ කරා මේ පොළට එන වෙළෙන්දන් සම්බන්ධව කිසිම තොරතුරක් සභාවේ ලේඛනගත වී නොමැති බවට. ඒකට පුළුවන් නම් ක්‍රමවේදයක් සකස් කරන්න සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. ඒක අපිට නෙමෙයි ඒ අයටයි අදාළ වෙන්නේ. ඒ අය ඒක දැනගන්න ඕන. අපි ටෙන්ඩර් එකක් දීලා තියෙන්නේ. අපි කටයුතු කරන්නේ ටෙන්ඩර්කරුවා සමග. අදාළ සෞඛ්‍ය තොරතුරු ගන්න අපි උදවු කරනවා. නමුත් අපි ඒකට බැඳිලා නැහැ. වෙළඳාම් කරන අයගේ තොරතුරු අපි ගාව තියෙන්න ඕන කියලා අපි බැඳිලා නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපිට යම් උදවුවක් අර කිවුවා වගේ කරන්න පුළුවන් නම් පොළ කාසි එකතු කරන කොට නම ලිපිනය ලියා ගන්න පුළුවන් නම් අපිට නාම ලේඛනයක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න බැරි නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ටෙන්ඩර් එක කරන කෙනාට කියන්න අපිට මේක දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සැරේ ටෙන්ඩර් එක ගත්තේ නැහැ කවුරුවත්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** බිලක් කඩන කොට විස්තර ටික ලියා ගන්න කියන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සභාවෙන් බිලක් කඩනවානේ. එතකොට නම ලිපිනය ලියලා දුරකථන අංකයත් ගන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** පෝද්දල පොදු වෙළඳ පොළ කඩ කාමර අටෙහි 2017-07-01 දින සිට 2019-12-31 දින දක්වා නව තක්සේරුව අනුව ගෙවිය යුතු හිඟ කඩ බදු මුදල වන රු.79,300.00ක මුදල පොත් වලින් කපා හැරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබුදූව වෙළඳ සංකීර්ණයේ අපි මේක කරා. අන්න ඒක මේ කියන්නේ. අළුත් තක්සේරුව අනුව අතරමැදි හිඟ ගාණ මේ. අළුතින් අපි අයකරා 2020 වර්ෂයේ ජනවාරි පළවෙනිදා ඉඳගෙන. මේක අපිට එවුවේ අලුතෙන් පසුදාතම් කරලා ගන්න කියලා. එතනයි මේ ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේක ගැටළුවක් වෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ආණ්ඩුකාරතුමාට යවලා මේකට අනුමැතිය ගන්නවා. මේක අපි ලබුදූව වෙළඳ සංකීර්ණයටත් කරා. ඒක තේරෙනවානේ. මේකෙදි වෙන්නේ 2017 ඉඳන් තක්සේරු කරනවා. නමුත් තක්සේරුව එන්නේ 2019 වර්ෂයේ අන්තිමේදී. එතකොට පසුදාතම් කරලා පසුගිය වර්ෂ දෙකක බදු මුදලත් ගෙවන්න කියලා තමයි එන්නේ. අපිට ඒක මෙහේ ගැටළුවක් වෙලා ඒ ටික කපා හැරියා. ඒකට අරගොල්ලත් ඉල්ලනවා ඒ අයගෙත් කපා හරින්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මෙහෙමයි වැඩේ තියෙන්නේ. අපි දැන් මේවාට කතා කරහම වෙන්නේ පෞද්ගලිකව මිනිස්සු තරහා වෙන එක. ඒක හින්දයි මම නම් කතා කරන්නේ නැත්තේ. එහෙම නැත්නම් මේ සභාවට එන ආදායමක් මේක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** තක්සේරු කරන කාලය ප්‍රමාද වුණාට මේක අය කර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙදි සභාව එකකට කරා. ලබුදූව වෙළඳ සංකීර්ණයේ කරපු හින්දා තමයි ඒ අය මේ ඉල්ලීම කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම යෝජනාවක් ගත්තේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට යෝජනාවක් ගත්තා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අප ප්‍රාදේශීය සභාවේ 2013 වර්ෂයේ සිට පැවත එන රු.761,992.59 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලාට ඒ විස්තර එවලා තියෙනවා. ඒක ගිණුම් ගත කිරිමේ වරදක් තියෙන්නේ. ඒක නිවැරදි කරන්න තමයි යෝජනා කරන්නේ. ඒකෙ විස්තර න්‍යාය පත්‍රය සමඟ අමුණලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකෙ තියෙනවා පොඩි පොඩි ගණන් ටිකක්. ශත ගණන් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ටික එකතු කරලා බලන්න. ඒක ගිණුම් නිවැරදි කරන්න කරන වැඩක්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** ගිංතොට කුරුඳුවත්ත සහ වැලිපිටිමෝදර යන ප්‍රදේශවල අප ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන තාවකාලික බලපත්‍ර මත පවත්වාගෙන යන පෞද්ගලික එළ ගව මස් කඩ දෙක සඳහා අයකරනු ලබන තාවකාලික බලපත්‍ර ගාස්තු 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සංශෝධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සංශෝධනය කරනවා කියන්නේ සභාපතිතුමා අඩු කරන්නද, වැඩි කරන්නද ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒකට අදාළ පාර්ශවයේ ලියුමක් මේකට අමුණලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අඩු කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අඩු කරන්න කියන්නේ කොරෝනා ප්‍රශ්න නිසා සහ අල්ලපු කඩ වල මාලු, කුකුල් මස් ඒවා විකුණනවා කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉතිං ඒක නතර කරලා දැම්මම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේක ගැන හොයලා බලලා එයා ඒ කියන කාරණා ඇත්තද කියලා බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕක අඩු කරලා වැඩක් නැහැනේ. කරන්න බැරි නම් වහලා දැම්මම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේක ගැන හොයලා බලලා එයා ඒ කියන කාරණා ඇත්තද කියලා බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕක අඩු කරලා වැඩක් නැහැනේ. කරන්න බැරි නම් වහලා දැම්මම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සම්පූර්ණයෙන්ම වහලා දැම්මම ඉවරයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වහලා දැම්මම ඉවරයි. ඒක තමයි කියන්නේ. අවසානයේ කුණු කතා එනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒකට කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කරන්න බැරි නම් වහලා දාන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් අපි සභා තීන්දුවක් ගමු මස් කඩ වහන්න. අපිට කඩේ අයිතියත් තැන්නම් අපිට අස්කරන්නත් බැරි නම් එහෙම කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ගේනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ තිබෙන සියළුම මස් කඩ වහලා දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක යම් ජන කොටසකගේ ප්‍රශ්නයක්. අපි ගව මස් නොකනවා වුණාට ගව මස් පරිභෝජනය කරන ජනතාවක් ඉන්නවා මේ කොට්ඨාශයේ. ඒක නිසා මේකට කල්පනාවෙන් තීරණයක් ගන්න කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉස්සෙල්ලා මේ ප්‍රශ්නය ඉවර කරලා ඉමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගාණ අඩු කරනවා නම් මම විරුද්ධයි පැහැදිළිවම. වහලා දාන්න කියන්න කරන්න බැරි නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කාරණයට මමත් එකඟයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සියළුම මස් කඩ වසා දමන්න යෝජනාවක් ගේමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඒ යෝජනාව ගේමු ලබන පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව ස්ථිර වුණේ නැහැ. සභාවේ විරෝධතාවය මත මේ යෝජනාව ප්‍රතික්ෂේප වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** බෙදීමකට යනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕන නැහැ. ඒකට මාත් එකඟයි. ඒ යෝජනාව ප්‍රතික්ෂේප වෙනවා. ඒ යෝජනාව මම ඉල්ලා අස් කර ගන්නවා.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සියළු දෙනාටම සුභ දවසක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මම මුලින්ම ස්තුති කිරීමක් කරන්න ඕන. 2020 වර්ෂයේ දෙසැම්බර් මස 09 වන දින මාගේ පියාණන්ගේ අභාවය සිදු වුණා. එයට ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ලබා දීපු සහයෝගය පිළිබඳව ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. මගේ පියාණන්ගේ අවමංගල්‍යය සිදු වූ මොහොතේ සිට මට නිතර කතා කරමින් කීප වතාවක්ම පැමිණෙමින් මට ලබා දීපු සහයෝගය පිළිබඳව ගරු සභාපතිතුමාටත්, ඒ වගේම සියළුම මන්ත්‍රීවරුන්ටත්, මන්ත්‍රීවරියන්ටත් මගේ ගෞරවණීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ගරු සභාපතිතුමාගේ මැදිහත්වීමෙන් මූල්‍යමය දායකත්වයකුත් මට ලබා දීලා තිබුණා. සියලු දේවල් වලට ගරු සභාපතිතුමනි ඔබතුමන්ටත්, ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන රාජ්‍ය නිලධාරියා වන ලේකම්තුමා ඇතුළු සියළු නිලධාරීන්ටත්, ඒ වගේම සියළුම සේවක මහත්ම මහත්මීන්ටත් ලබා දීපු සහයෝගය වෙනුවෙන් මගේ ගෞරවණීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

**08.** අඹගහවත්ත, මල්මාවත, පත්තිනිදූව මාර්ගයේ අවසන් කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 09.** අඹගහවත්ත ඉහළ කන්ද ප්‍රදේශයට පිවිසෙන පටු මාර්ගය පිහිටි ආකාරයටම කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමත්, ඒ ප්‍රශ්නය බලන්න ගියා. ඒ ප්‍රදේශයේ අය ඉල්ලීම් කරලා තියෙනවා මේ මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා. මේකට ඉක්මනට ප්‍රතිපාදන ටිකක් මට ලබා දෙන්න කියලා ඉල්ලීම් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 10.** අඹගහවත්ත, ජංචිගේවත්ත මාර්ගයේ අවසන් කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 11.** කපුහෙම්පල, දොස්තරදූව මාර්ගයේ අවසන් කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 12.** කපුහෙම්පල කොට්ඨාශය සඳහා එම කොට්ඨාශයේ සුදුසු තැනක පුස්තකාලයක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල කොට්ඨාශයේ දරුවන්ට සහ ඒ ප්‍රදේශවාසීන්ට පුස්තකාලයක ලොකු අඩුපාඩුවක් තියෙනවා. කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ හරි, තොටගොඩ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පරීක්ෂණාගාරයේ වසා දමුණු ශාලාවේ හරි කොට්ඨාශයේ දරුවන්ට වගේම ප්‍රදේශවාසීන්ට පුස්තකාලයක් ඉදිකරලා දෙන්න. ඒකෙ ලොකු අවශ්‍යතාවයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ දැන් මුකුත්ම නැද්ද.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකෙ පරීක්ෂණාගාරයක් තියෙන්නේ. ඒකත් එක කොටසක තියෙන්නේ. අනිත් කොටසේ මේ වගේ ශාලාවක් තියෙනවා. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති චන්දිම මහතා සමඟ සාකච්ඡා කරලා ඒක ලබා ගත්තොත් මෙහේ නිලධාරීන් දෙදෙනෙක් අනුයුක්ත කරගෙන අපිට ඒක කර ගන්න පුළුවන් නම් ඒක වටිනවා. ප්‍රදේශයේ කට්ටියගේ ලොකු උනන්දුවක් ඒකට තියෙනවා. කිහිප දෙනෙක්ම මේ සම්බන්ධව මාත් එක්ක කතා කරා. අවශ්‍ය පොත් පත් එයාලගේ මොකක් හරි සංවිධානයක් මඟින් එකතු කරලා දෙන්නත් කල්පනා කරලා තියෙනවා. අපිට උදවුවක් කරන්න බැරි වෙයිද සභාපතිතුමා මේ වැඩේට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියත් එක්ක කතා කරලා බලමු.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** චන්දිම මහතා ඔබතුමාගේ හිතවතෙක්නේ. පොඩ්ඩක් කතා කරලා බලන්න. එහෙම නැත්නම් කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ කරන්න පුළුවන්. මේ අවුරුද්දේ ප්‍රතිපාදන වෙන් කරා ඒකෙ ඉතුරු වැඩ ටික කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කාර්ය මණ්ඩලය යෙදවීම තමයි ගැටළුව වෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** දෙන්නෙක් අනුයුක්ත කර ගන්න පුළුවන් නම් හරි ඒ වගේ තැනකට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න කියන්න.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක ක්‍රමවත්ව යන්නේ නැහැ මන්ත්‍රීතුමා. නිලධාරියෙකුට රාජකාරිය පවරලා දුන්නොත් තමයි රාජකාරිය හරියට වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි පළාත් පාලන ආයතනයෙන් ඉල්ලීමක් කරන්නම් කාර්ය මණ්ඩලයේ වෙනසක් කරලා හරි තව කෙනෙක්ව බඳවා ගන්න අවසර දෙන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට මොකක් හරි බලමු. ලොකු දෙයක් ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 13.** කපුහෙම්පල, සේනානායක මාවතේ දිල්රූ ටෙක්ස්ටයිල් ආයතනය ඉදිරිපිට මාර්ගය සහ කිතුල් වැඩපළ ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ එකම මාර්ගයද.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මාර්ග දෙකක්. යෝජනා දෙකක් මේ. දිල්රූ ටෙක්ස්ටයිල්ස් ඉදිරිපිට මාර්ගය එකක්. කිතුල් වැඩපළ අසල මාර්ගය තව එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් දැම්මා. ඒක හැලිලා තියෙනවා. ඒ යෝජනාව වුණේ සභාපතිතුමනි පහුගිය දෙසැම්බර් 25 වෙනිදා නත්තලට පෙර අපේ රජය විසින් වැටුපට සරිලන ක්ෂණික ණයක් ලබා දෙන්න යෝජනා කරා රුපියල් 25,000.00 ක. මහජන බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවෙන් අපි ඒක ලබා ගන්න ඉල්ලීම් කරා. අන්තිමට මම ඒක ප්‍රතික්ෂේප කරලා ආවා. මහජන බැංකුවේ ගාල්ල, කොටුව ශාඛාවට මේ ණය මුදල ලබා ගන්න රාජ්‍ය නිලධාරීන් ආවම ඒ බැංකුවේ කළමනාකරු හැසිරුණු විදිය ගැන මට පුදුම හිතුණා. රජයේ නිලධාරියෙක් එතනට ඇවිල්ලා ඒ සේවය ඉල්ලන්නේ. කිසිසේත්ම ඒක තැකීමකට ලක් නොකර ඒ අයට දෙස් දෙවොල් තියනවා. ඒක ප්‍රතික්ෂේප කරනවා. මම අන්තිමට බැංකුවේ කළමනාකාරතුමාගෙන් ඇහුවා ඇයිද කියලා ඔබතුමා මෙහෙම කරන්නේ. ඊට පස්සේ මම විපරම් කරලා බැලුවා වෙනත් බැංකුත් එක්ක මේ සම්බන්ධව. වෙනත් බැංකු එක්ක කතා කරහම කිවුවා කරාපිටියේ බැංකු ශාඛාවේ 31 වෙනිදා වෙන කොට ඒක ගෙවලා ඉවරයි කියලා. අනෙකුත් බැංකු වලටත් කතා කරහම ඒ බැංකු වලත් මේක ගෙවලා ඉවරයි. හැබැයි ජනවාරි 10 වෙනිදා වෙනකනුත් සල්ලි දැම්මේ නැහැ මහජන බැංකුවේ ගාල්ල කොටුවේ ශාඛාවෙන්. ඒ නිලධාරීන් ඇවිල්ලා ගියේ අවශ්‍යතාවයකටනේ. නමුත් ඒක ශත පහකට මායිම් කරේ නැහැ මහජන බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවේ කළමනාකාරතුමා මේ නිලධාරීන් පිළිබඳව. ඒ නිසා නැවත මේ වගේ දේවල් නොවෙන්න ඕන. මේක රාජ්‍ය බැංකුවක්නේ. රාජ්‍ය බැංකු වලින් මෙහෙම වෙනකොට රජයේ නිලධාරීන් මොන තරම් අපහසුතාවයකට පත්වෙනවද සභාපතිතුමනි. ඒ නිසා තමයි මම මේ යෝජනාව දැම්මේ. මොකද මේවා ගැන ඉහළ අය දැනුවත් කරන්න ඕන. මේ සමහර බැංකු නිලධාරීන් යම් යම් දේශපාලන ක්‍රියාවලීන් වල නිරතවන බවයි මට පෙනුනේ. මම අන්තිමට එතුමාට විස්තරය කියලා එළියට ආවා. දැන් සභාපතිතුමනි, මේ කාර්යය නිසා වෙච්ච වැරැද්ද බලන්න. මේ ගැන අපේ රජයේ ඉහළ නිලධාරීන්ව දැනුවත් කරන්න තමයි මම මේ යෝජනාව දැම්මේ. හැබැයි ඒ යෝජනාව තිබුණේ නැහැ. ඔබතුමාට ඒ යෝජනාව සම්බන්ධව මොකක් හරි ගැටළුවක් තියෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි උප සභාපතිතුමා, ඒක ඔබතුමාට උප සභාපතිවරයා විදියට කරන්න පුළුවන්. නමුත් සභාවක් විදියට අපි ඒ මට්ටමේ දේවල් කරන්න ගියොත්, ඒවගේ දේවල් වලට ලියුම් දාන්න ගියොත් සභාවට හොඳ නැහැ. ඒක අපේ ප්‍රාදේශීය සභාවෙන් බාහිර කටයුත්තක්. ඔබතුමාට සභාවේ උප සභාපතිවරයා විදියට ඒ හයිය තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතුමා දාපු යෝජනාව දැම්මත් බැංකු වලට ලියුම් යවන්න බැහැ. ඉහළ දේශපාලන තීන්දු තීරණ ගන්න තැන් වලටයි මේක යවන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට සභා තීන්දුවක් ගන්න අවශ්‍ය නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මුදල් ඇමතිතුමා විදියට අගමැතිතුමා යටතේ තමයි රාජ්‍ය බැංකු තියෙන්නේ. එතකොට අගමැතිතුමාට ඕන මේක යොමු කරන්න.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ නිලධාරීන් බැංකුවේ කළමනාකාරතුමාව හමුවන්න එන්නේ අවශ්‍යතාවයටනේ. එහෙම ගිය වෙලාවට කිසිසේත්ම සලකන්නේ නැතුව ගියාම මට හරිම හිතට වේදනාවක් දැනුනා. මම එවෙලේම ඇහුවා කළමනාකාරතුමාගෙන් මොකක්ද මේ කරන වැඩේ කියලා. මේකට එතුමන්ලට කරන්න දෙයක් නැහැ, එතුමන්ලටත් අවුරුද්ද නැහැ කිවුවා. මම කිවුවා ඔබතුමන්ලාට අතිකාල දීමනා, බටා ගෙවනවා කියලා. මම ආවා ඒක තියා ගන්න කියලා. සමහර හොඳ නිහතමානී නිලධාරීන් ඉන්නවා ඒ බැංකුවේම. ඒකයි මම ඇතැම් නිලධාරීන් කියලා ඒ යෝජනාව දැම්මේ. කළමනාකාරතුමා සම්පූර්ණයෙන්ම සතෙක් වගේ හැසිරුනේ ඒ දින කිහිපයේදී. ඒක බොහොම පැහැදිළිව කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** රාජ්‍ය නිලධාරීන් නිසා තමයි මේ බැංකු රැකෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ මිනිස්සු වෙනුවෙන් කොච්චර ඇගයීමක් තියෙන්න ඕනද, එපමණයි ගරු සභාපතිතුමනි. මේ ප්‍රශ්නය ගැන ඉහළ නිලධාරීන්ව දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක දාන්න පුළුවන් කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි ඔබතුමන්ලාට.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා**

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 14.** නරාවල, කළුවගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 15.** මාර්ටින් පෙරේරා මාවත කිනිහිටියාගොඩ මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 16.** වැවේවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 17.** ඇබිලිකැටිය වත්ත කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 18.** කුරුන්ද කන්ද, උදය දිලීප් කුමාර වික්‍රමගේ මහතාගේ නිවස අසළින් ඇති කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, එතනදී මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍ය වෙනවා. කුරුන්ද කන්ද මුදුනේ ඉඳලා එන ලොකු වතුර පාරක් දිලීප් කුමාර මහතාගේ ඉඩමේ මිදුල මැදින් තමයි පාරට ගලා බසින්නේ. හැමදාම වහින වෙලාවට ගේ ඇතුළට පවා වතුර යනවා. මම හිතන්නේ මිදුල මැදින් කාණු පද්ධතියක් සකස් කිරීම තමයි මේකෙදී කරන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාක්ෂණ නිලධාරිතුමා බලලා තීරණය කරාවි.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** හැබැයි ඒක හැමදාමත් තිබුණා. පහුගිය දවසක පාර කොන්ක්‍රීට් කරාට පස්සේ වතුර පාර දන් එයාලගේ මිදුල මැදින්ම තමයි ගලා ගෙන යන්නේ. කාණුවක්වත්, දොළ කාණුවක්වත්, මොනවක්වත් එතන නැහැ. එයාගේ වත්ත මායිමේ දොළ කාණුවක් තියෙනවා. මිදුල මැදින් ඇවිල්ලා මිදුලේ වතුර පිරීම නිසා ගේ ඇතුළට වතුර එන තත්ත්වයක් තියෙන්නේ. ඒක ගැන පොඩ්ඩක් දැනුවත් වුණොත් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 19.** ලබුදූව ඕකිඩ්ස් බේකරිය අසළ පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 20.** ගුරුදොළ වත්ත මාර්ගයේ සිලින්ඩර් යොදා කාණු පද්ධතියේ ජලය බැසයන ආකාරයට සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 21.** ගොඩකන්ද මාර්ගයේ කරාපිටිය සමූපකාර මල් ශාලාව අසළ කාණුවට වැසිකිළි අපද්‍රව්‍ය ගලා ඒම නිසා දැඩි දුගදක් හමායන බැවින් මේ පිළිබඳව ආයතනයන් දැනුවත් කරමින් අවශ්‍ය නීතිමය පියවර ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඒක දීර්ඝකාලීන ගැටලුවක්. පහුගිය කාලයේ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා එක පුද්ගලයෙක් සතුටු කිරීමට කාණුවක් හදලා දුන්නා ඒ පුද්ගලයාගේ ඉඩමෙන් අලුතෙන් ඉදිවෙන මාතෘ රෝහලට යන්න පාරක් දෙන්න පොරොන්දුව පිට. ඒ මාර්ගයත් දැන් වෙනස් වුණා. පර්චස් අටක පමණ නිවසක් ඒක. කඩ කාමර හයක් විතර එතන තියෙනවා. ඒකෙ සියළුම ගලිබට කාණුවට දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දැනුවත් කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක ගැන දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියත් දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාරේ අයිතිය කාටද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ආයතන දෙකටම ලිඛිතව දන්වන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 22.** ගොඩකන්ද සේවා පියස භූමියේ ළමා උද්‍යානයක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 23.** අප බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සහ ඇළ මාර්ග අවහිරකිරීම් තාක්ෂණ නිලධාරීන් විසින් නතරකිරීම සිදුකළද නිවාඩු දවස්වලදී හෝ මොනයම් අකාරයකින් එම කටයුතු කරගෙන යාම තුළින් ප්‍රාදේශීය සහා පනත පවා හැල්ලුවට ලක්වීම සිදු වේ. එම නිසා අදාළ ස්ථානයන් හඳුනාගෙන නීතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මෙතනදී දැන් බැලුවම මගේ කොට්ඨාශය වෙන කරාපිටිය කොට්ඨාශයේ ප්‍රශ්න ගැන මම නිරන්තරයෙන්ම තාක්ෂණ නිලධාරි දිනූෂ මහතාට කතා කරලා කියනවා. දිනූෂ මහතාත් එතනට ඇවිල්ලා බලලා යනවා. හැබැයි ඊට පස්සේ හදනවා. පසුගිය කාලයේ වැඩ කරන එක නවත්වලා ගියපු ස්ථානයක ඉටිකොළයක් ඇද්දා. ඉටි කොළය ගලවනකොට තාප්පයක් එතන. දැන් මේකට අනිවාර්යයෙන්ම ක්‍රියාමාර්ග ගන්න ඕන. ඉටිකොළය ඇදලා වහලා තිබ්බා දිනූෂ මහත්තයා වැඩේ නවත්වපු නිසා. ඒ වගේ ප්‍රශ්න තිබුණා. මම හිතන්නේ තවත් තැනක අත්තිවාරම දාන්න මුල්ගල තියන්න අවසර දුන්නා. දැන් ඒ මිනිස්සු ගෙදර හදාගෙන දෙවැනි තට්ටුවෙත් වැඩ කරනවා. ඒ ගෙදර හදපු ඉඩම ළඟ අඩි තුනක විතර කාණුවක් තිබුණා. ඒ කාණුව දැන් වහලා. මේක නවත්වන්න බැරි තැන මම ගිහින් කතා කරා. තාප්පය සිලින්ඩරය මැදින් එන්නේ. එයාගේ මායිමේ කිවුවා තාප්පය බඳින්නේ අන්තිමට. අපිට සභාවෙන් කිවුවා කියලා කිවුවා මුල්ගල තියා ගන්න කියලා. මුල්ගල තියපු එක දැන් පැළ

වෙලා මම හිතන්නේ. දැන් දෙවැනි තට්ටුවේ වැඩ කරමින් යන්නේ. ඒ ගෙදර හදාගත්තට අපිට කමක් නැහැ. කුඹුරු ඉඩමක් එක පැත්තකින් ඒක. ඒකයි ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, පොඩ්ඩක් මතක් කරන්න ඕන. කිරිමැටිමුල්ලවත්ත, නන්දපාල මහතාගේ ඉඩම ඉදිරිපිට ගෙයක් හදනවා. දැන් මේ දවස්වල අත්තිවාරමේ කටයුතු සිදුකරන ගමන් ඉන්නේ. එතන ගස් කපපු ගමන් ලියනගේ මන්ත්‍රීතුමා හදපු පාර කැඩුණා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** සම්පූර්ණයෙන්ම පාරත් කඩලා. මම බැනලා ආවා ගිහිල්ලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** දැන් එතන පාර කැඩිලා ගිහිල්ලා තියෙනවා. එයාලා කවුරුවත් ඒකට වගකියන්නේ නැහැ. අවට ගෙවල් වලින් ඇහුවම කවුද කරේ කියලා එහෙන් කියනවා ගස් ටික කපපු නිසා කියලා. ඒක ලොකු හානියක් පාරට. වැඩි කාලයක් නැහැ තාර දාලා පාරට. අපරාදයක් ඒක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** මම ගිහිල්ලත් බැලුවා. කාණුවත් වහලා තිබුණා. දැන් ගමේ ඔය ගෙවල් ටික පෞද්ගලිකව තරහා වෙලා තියෙනවා. දැන් වතුර ප්‍රශ්නයට විසඳුමක් එන්නේ කොහොමද මේක මේවා කරාට පස්සේ. ඒක හින්දා මම කියන්නේ ඒ සියලු දෙවල් වලට අපි නීතිමය ක්‍රියාමාර්ග පොදුවේ ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මටත් ගැටළුවක් තියෙනවා. නිවාඩු දවස් වල හදන එකට. මේකට මොකක් හරි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** සෙනසුරාදා, ඉරිදා තමයි මේවා යොදා ගන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** අපි ප්‍රසිද්ධියට දෙක තුනක් ඉලක්ක කරලා ඒ ඉදිකිරීම් කඩමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි මෙහෙම කරමුද. දැන් ඇත්තටම ඕකෙදී ගැටළුවක් තියෙනවා. ගොඩක් වෙලාවට තාක්ෂණ නිලධාරීන් 90% ක් දුරකථනයට ප්‍රතිචාර දක්වනවා. අපිට වුණත් මුකුත් කියන්න බැහැනේ නිවාඩු දවස් නිසා. ඉතිං ඒක හින්දා සමහර වෙලාවට එතන ලොකු ගැටළුවක් තියෙනවා. ඒ නිවාඩු දවස්වල ප්‍රශ්නය තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** ගැටළුව වෙලා තියෙන්නේ සභාපතිතුමා තාක්ෂණ නිලධාරීන් ගිහින් දැනුවත් කරලා එනවා. නමුත් අපිට අධීක්ෂණයක් නැහැ මේ පිළිබඳව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපිට මෙහෙම කරන්න බැරිද. නීතිය ක්‍රියාත්මක කරනවට වැඩිය අපි මූලික වැඩේ කරන්න එපැයි. එතනදී අපිට බැරිද සෙනසුරාදා, ඉරිදාටනේ මේ නිලධාරීන් යොදවන එකේ ප්‍රශ්නය තියෙන්නේ. ඒකෙන් කියන්නේ නැහැ ඒ රාජකාරිය කරන්න ඕන කියලා සති අන්තයේ නිසා. ඔය වගේ දෙයක් තමයි වෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** සභාපතිතුමා එක තැනක හදන්නේ රෑ 9.00 ට නේ අන්තිමට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** පළවෙනි කාරණය මෙහෙමනේ. අපි නවත්වන්න ඕන ගිහිල්ලා. ඒකට ඇහුම්කන් නොදුන්නොත් තමයි දෙවැනි කාරණය අපි කරන්න ඕන. ඉතිං පළවෙනි කාරණය විදියට මේ කතා වෙන්නේ නිවාඩු දවස් වල කරන එකනේ. ඉතිං එතනදී අපේ නිලධාරියෙක්ව මේකට සම්බන්ධ කර ගන්න අපිට ක්‍රමවේදයක් තියෙන්න ඕන. නිලධාරීන් සමහරු ප්‍රදේශයෙන් බැහැරට ගිහින් ඉන්නේ. කොට්ඨාශයට අදාළ තාක්ෂණ නිලධාරියාම යවන්නත් ඕනනේ. සමහර වෙලාවට ප්‍රදේශයෙන් බැහැරට ගිහිල්ලා ඔවුන් ඉන්නේ. ඉතිං අපිට කියන්න බැහැ ප්‍රදේශයටම වෙලා ඉන්න කියලා සතියේ දවස් හතේම. මොකක්ද ඒකට ඔබතුමන්ලා දෙන විසඳුම. අපිට බැරිද අතිරේක නිලධාරියෙක්ව තියලා බලප්‍රදේශයේ වෙන ඒවා නවත්වන්න. ඒකට මොකක් හරි ක්‍රමවේදයක් සකස් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා :-** දීමනාවක් දෙන්න බයිසිකලයෙන් යන නිසා. ඒකට වැඩපිළිවෙලක් හදන්න. මම අදහස් කරේ ඒකත් නෙමෙයි. තාක්ෂණ නිලධාරීන් කොහොම හරි එතනට ගිහින් ඒක නවත්වලා ආවා කියලා හිතමු. එක්කෝ දේශපාලන සම්බන්ධතා මත හෝ හිතවත්කම් මත ඒ දේවල් කරනවා. එතකොට අපිට අහක බලාගෙන ඉන්න සිද්ධ වෙලා තියෙනවා. එහෙම කරන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒවා නතර කරන්න වගකීම පවරන්න බැරිද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** නතර කරාට පස්සේ කරන එකයි ගැටළුව වෙලා තියෙන්නේ. සියළුම ඒවා දිනූෂ මහත්තයා නතර කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නවත්වපු ඒවාට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත්තා. ඒකට මම කොයි වෙලාවකවත් එපා කියලා නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** පන්සලේ හාමුදුරුවන්ගෙන් මේ ප්‍රශ්නය නිසා ඉන්න නැහැ. ඉටිකොළයක් බැඳගෙන තාප්පය බැඳලා වැඩ ඉවරවුණාම ඉටිකොළය ගලවලා දාලා. මේකෙ මම නම් දකින්නේ අපි මේක ගැන කියලා නැවැත්තුවට පස්සේ මේ ගැන ක්‍රියා කරන්නේ නැති ගැටළුව තියෙන්නේ. ප්‍රසිද්ධියේ අලාභයක් වෙන්න කඩලා දැම්මා නම් හරි දෙක තුනක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක හැම සභාවකම කතා වෙන දෙයක්නේ. දැන් ඇත්තටම නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්න මම බලපෑම් කරන්නේ නැහැනේ. තාක්ෂණ නිලධාරීන් ගිහිල්ලා වැඩ නවත්වන ඒවා ආයේම කරන එකේ අගෞරවය තියෙන්නේ ඒ අයටමනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය සන්සයිඩ් වත්තේ ඉඩමක් තියෙනවා. ඒකෙ අඩි එක හමාරේ කාණුව එක තැනක අඟල් හතරයි තියෙන්නේ. එතන ගේට්ටුවක් සවි කරන්න කණු දාලා තියෙනවා. දැන් මම එතනට ගිහින් ඒක නවත්වනවා. එහෙම යන්න බැහැනේ. කිරිමැටිමුල්ලේ කාණුවක් වහලා තිබුණා. මම ඒකටත් බැනලා ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අර ග්‍රේබියල් වෝල් එකක් තියෙන එකේ ප්‍රශ්නය කොහොමද, එතනට ගියාද, දැක්කද ඒක. කොහොම හරි ඒක නම් බොහොම පරිස්සමට කරන්න ඕන වැඩක්. ඒක දැක්කම ඇඟ හිරි වැටෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** බංගලාවත්තේ එකට තවම කිසිම පියවරක් අරගෙන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් නවත්වලා තියෙන්නේ ඒක. ඒකට අනුමත කරන්න මෙහෙට දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඊයේ කොන්ක්‍රීට් එකක් දාන්න ඇවිල්ලා නැවැත්තුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නම් එකඟ නැහැ ඒකට. අපෙන් නම් අනුමැතිය දෙන්න එපා වෙන ඕන ආයතනයකට දාන්න ඒක. අපෙන් නම් අනුමැතිය දෙන්න එපා. අඩි 30 ක් විතර උස කලු ගල් බැම්ම ග්‍රේබියල් දාලා හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක දැන් පුපුරලා ඇවිල්ලා තියෙන්නේ. කිසිම විදියකින් ඒකට අනුමැතිය දෙන්න බැහැ. කඩිනමින් ඒක ඉවත් කරන්න සිදු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙට අනුමැතියට දාපුවා බලන්න. අපිට අනුමැතියට දාලා අඩුපාඩු තියෙන ඒවා සාකච්ඡා කරලා බලමු. මෙහෙට අනුමැතියට දාලා අඩුපාඩු තියෙන ඒවා නැතුව අනිත් ඒවා තාක්ෂණ නිලධාරීන් ගිහිල්ලා බලලා නැවැත්තුවට පස්සේ නැවත වැඩ කෙරිලා තියෙනවා නම් ඒවාට කිසිම දෙයක් බලන්නේ නැතුව නඩු දාන්න. මම හැම වෙලේම කියන කාරණාවක්නේ ඉතිං ඒක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** හදලා ඉවර වුණාට පස්සේ අනුමත කර ගන්න රටාවක් නැහැනේ. මේක ප්‍රතික්ෂේප කරලා නඩු දැම්මා නම් ඉවරයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** නඩු දාන්න කෙසෙල්වත්තෙන් පටන් ගන්න කියන්න ඉස්සෙල්ලා. තාම ඒක නැහැනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, තව දෙයක් තියෙනවා. කිරිමැටිමුල්ල වත්තේ නන්දපාල මහතාගේ ගෙවල් වලට යන පාර හරහා විදුලිය අරගෙන තියෙනවා. පොඩි ළමයෙකුට හරි ඒක පැගුණොත් හොඳ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිනූෂ මහත්තයා ඉස්සෙල්ලම ලියනගේ මන්ත්‍රීතුමා ඔය කියන ටික තියෙනවානේ, ඒ ටික අරගෙන මෙහෙට අයදුම්පත්‍ර දාලා තියෙනවා නම් ඒවාට අනුමැතිය ලබා දීම සඳහා අපි දෙපාරක් හිතමු. ඒකට අනුමැතිය දෙන්න පුළුවන්ද බැරිද කියන කාරණය වෙනයි. අනිත් ඒවාට, අපේ කීම අහන්නේ නැතුව කරපු ඒවාට නඩු දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දිනූෂ මහත්තයා තුන් හතර පාරක්ම ඔතනට ගිහිල්ලත් තියෙනවා. නවත්වන්න ගිහිල්ලා ඒ ටිකත් කරලා තියෙනවා. නමුත් ඒ අය නැවත ඉදිකිරීම් කටයුතු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අරකට නම් එකඟතාවයක් ආවා. අර විවේකාරාම මාවතේ හැරෙන තැන ගමේ අය එක්ක ප්‍රශ්නයක් ආපු ඉදිකිරීමට. මමත් ගිහින් ඒකට පොලීසියත් සමඟ කතා කරා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ විවේකාරාම පාර නෙමෙයි කිරිමැටිමුල්ල පාර. කරාගොඩ වත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඒකට ගමේ අයත් එක්ක ඇවිල්ලා දැනට එකඟතාවයකට ඇවිල්ලා තියෙනවා. පර්චස් තුනයි ගාණක ගෙයක් ඉදිකරන ගැටළුව ඒක. ඒක දැනට සමථයකට පත් වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අරකට ඉක්මනින් විසඳුමක් ගත්තා නම් හරි සභාපතිතුමා. ඒක පාර හරහා දාලා තියෙන්නේ. වයර් එකෙන් විදුලිය පොඩ්ඩක් හරි කාන්දු වුණොත් හොඳ නැහැ. පොඩි ළමයි සෙල්ලම් කරනවා එතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද ඒ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** නන්දපාල මහතාගේ ගෙවල් ගාව. පාර හරහා වයර් එක නිකං දාලා තියෙන්නේ. කිසිම ආරක්ෂාවක් නැහැ ඒකෙ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ප්‍රදේශය විදුලි බල මණ්ඩලයේ බටදූව කාර්යාලයටද, ගාල්ල කාර්යාලයටද අයිති. ගොඩකන්දේ කොටසක් ගාල්ල කාර්යාලයට අයිති වෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** නාවුක හමුදා කඳවුර ගාව තියෙන මකුළුවේ තියෙන කාර්යාලයට අයිති. මාගාල්ලේ කාර්යාලයට ඒක අයිති වෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ පාරේ පොඩි ළමයි යනවා, සෙල්ලම් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද හරියටම තැන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කිරිමැටිමුල්ල වත්ත පාරේ වංගුව ගාව කෙලවරේ. පිං ළිඳ ගාවින් යනකොට කෙලවරේ තුංමන් හන්දිය ගාව. ඉඩමට විදුලිය අරගෙන තියෙනවා පාර හරහා. ඒ පාරේ පොඩි ළමයි සෙල්ලම් කරනවා. හදිසියෙන්වත් වයර් එක පැටලිලා මොකක් හරි වුණොත් කවුරුවත් මුකුත් කරන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ එක්කම දැන් වැසි කාලය ඉදිරියට එනවා. මාස දෙකක් වෙනවා දැන් අපිට අර බැම්ම ගැන දැනුම් දීලා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් අපිට දැනුම් දීලා තියෙනවා මේක අනතුරුදායක නිසා ඉවත් කරන්න කියලා. බංගලාවත්ත ප්‍රදේශයේ තියෙන ඒ අනතුරුදායක බැම්මට මොකක් හරි තීරණයක් ඉදිරි සතිය ඇතුළත ගන්න. ඒ අයට අනතුරුදායක තත්ත්වය ඉවත් කරන්න බැම්මේ කොටසක් හරි කඩලා ඉවත් කරමු. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙනුත් ඒක තීන්දු කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනවසරයෙන් ඉදි කරලා තියෙනවා නම් වහාම ඒක ඉවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ග්‍රේබියල් වෝල් එක දාපු එකද, මගෙත් ඒකට ප්‍රසාදයක් නැහැ. ඒක දැක්කම ඇඟ හිරි වැටෙනවා. මම දන්නේ නැහැ ඒක කවුරු කරාද කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒකෙ කොටසක් හරි දැනට ඉවත් කරවලා තියන්න. දැන් ඒක පුපුරලා තියෙන්නේ. ඒක ගේ උඩට වැටුණට පස්සේ කතා කරලා වැඩක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක දැනුවත් කරලනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒකට අනුමැතිය ගන්නකම් හදපු එකෙන් බාගයක් ඉවත් කර ගන්න කියන්න. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් මෙහෙට ලියුමක් එවලා තියෙනවා. ඒකෙ පිටපතක් හම්බ වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 24.** කරාපිටිය, කිරිමැටිමුල්ල ඉන්ග්ලන්ඩ් හිල් මාර්ගය සම්බන්ධ වන ස්ථානයේ ජලය බැසයාම සඳහා සිලින්ඩර් යෙදීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 25.** ජස්ටින් කන්ද ප්‍රධාන මාර්ගයේ සීතා මහත්මියගේ නිවස අසළ කාණුවට සිලින්ඩර් යෙදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 26.** ජස්ටින් කන්ද සුසාන භූමියේ සෙහොන් ගෙයක් සාදා එහි පාලනය හිරිඹුරගම දිරිය සුභ සාධක සමිතිය වෙත පැවරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ජස්ටින් කන්දේ සොහොන් භූමිය තියෙනවා. මෘත දේහයක් භූමදානය කරන්න ගෙනාවම මිහිදන් කරනකම් තියන්න තැනක් එතන නැති නිසා අපි අඩු වියදමින් ඒක හදලා දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 27.** ජස්ටින් කන්ද මාර්ගයේ කෝන්ගහ අසළ සිට ආනන්ද මහතාගේ නිවස දක්වා ඇති පැති කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 28.** නරාවල, කාසල්හිල් වත්තේ පුෂ්පකුමාර මහතාගේ නිවස අසළ ඇති පොදු ළිඳ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 29.** පන්විල ගොවිපල අසළ තිලක් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 30.** පන්විල, සිට්ට්‍රස්වත්ත මාර්ගයේ ඉෂාන්ත කලංසූරිය මහතගේ නිවස ඉදිරිපිට වෙල් යාය අසළ වතුර පිරී ඇති බැවින් සභාවේ බැකෝ යන්ත්‍රය භාවිතාකොට ජලය බැස යාමට හැකිවන පරිදි කාණුව කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එතන ඉස්සරහ වෙලේ වතුර පිරිලා අවට ගෙවල්වල ළිං වල වතුරත් භාවිතා කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙන්නේ. ඉෂාන්ත මහත්මයා නම් ඒක කරන්න ඉඩ දෙන්නේ නැහැ දනට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 31.** කාසල්හිල් වත්තේ මල්කාන්ති මහත්මියගේ නිවස අසළින් ඇති පොදු කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 32.** දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට නරාවල, ගොඩගෙදරවත්ත අසළින් ගලා බසින කාණුව ක්‍රමවත්ව පවිත්‍ර කිරීමට අදාළ බලධාරීන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකෙදී බෝපෙ පෝද්දල බල ප්‍රදේශය හරහා යන අධිවේගී මාර්ගයේ ආසන්නයේ තියෙන කාණු පද්ධතිය සුද්ධ කරන්න කියලා ඒ අදාළ ආයතන දැනුවත් කරන්න. මොකද වහින කොට ඒ ඔක්කොම අවහිර වෙලා වතුර පාර එනවා. ඒ නිසා ගංවතුර හට ගන්නවා. ඒක සභාවට අයිති නැහැ. මම හිතන්නේ ඒක මාර්ග සංවර්ධන අධිකාරියට අයිති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යවන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 33.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මුලන නලින් මහතාගේ නිවස ඉදිරිපිට ඇති කුඹුරු ඉඩමේ අප ප්‍රාදේශීය සභාව මගින් මිරිදිය මසුන් ඇති කිරීමේ වැඩසටහනක් ඇති කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක සම්බන්ධීකරණ කමිටුවටත් යෝජනා වෙලා ඉඩම පැවරීමේ කටයුතු සිදු කර ගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 34.** නරාවල පන්සල වත්ත මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 35.** බෝපෙ පෝද්දල බල ප්‍රාදේශයේ වීදි පහන් සවි කිරීමට නොහැකි මාර්ග සඳහා සූර්යය බල ශක්තියෙන් ක්‍රියාකරන වීදි පහන් සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මොකද, සමහර තැන් වල ලයිට් කණු නැහැ. ඒ නිසා මේ මාර්ග රාත්‍රියේදී කළුවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හොඳ යෝජනාවක්. ඒක කීපපාරක්ම මතු වෙච්ච ගැටළුවක්. අපිට මහා ලොකු ප්‍රමාණයක් අවශ්‍ය වෙන්නේ නැහැ. නැති තැන් වලට, සර්විස් වයර් ගියපු තැන් වලට වගේ වීදී පහන් කට්ටල දාන්න බැරි තැන් තියෙනවානේ. ඒකට අපි බලමු මොකද කරන්න පුළුවන් කියලා. මේක අනිවාර්යයෙන්ම කරන්න ඕන.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 36.** කිතුලම්පිටිය, උදාර පෙදෙසේ කපිල දහනායක මහතාගේ නිවස අසළ මාර්ගය හරහා දැල් සහිත බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 37.** රත්නගිරිවත්ත - පැලවත්ත ප්‍රධාන මාර්ගයේ ඥානසිරි මහතාගේ නිවස ඉදිරිපිට ඇති අතුරු මාර්ගය හරහා ඇති පෙට්ටි බෝක්කුව මත යකඩ දැලක් යොදා සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 38.** තුංහිරිපාන, කපුගොඩවත්ත රත්නසිරි මහතාගේ නිවස අසළ මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට සහ කාණු පද්ධතිය ඉදිකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ.චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 39.** මාම්පිටිය සිල්වරින් ගාර්ඩන් මාර්ගයේ ඉතිරි කොටස සඳහා සපත්තු කාණුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ඊළඟට තුසිත මන්ත්‍රීතුමාගේ යෝජනා තියෙන්නේ. එතුමා අද මහා සභා රැස්වීමට නොපැමිණි නිසා ඒ යෝජනා මම ඉදිරිපත් කරන්නම්.

තුසිත මන්ත්‍රීතුමයි, ටෙක්ලා මන්ත්‍රීතුමියයි දුරකථනයෙන් දැනුම් දුන්නා අද මහා සභා රැස්වීමට සහභාගි වීමට හැකියාවක් නැහැ කියලා. ශ්‍යාමිකා මන්ත්‍රීතුමියත් ලිපියක් එවලා තියෙනවා අද මහා සභා රැස්වීමට සහභාගි වෙන්න හැකියාවක් නැහැ කියලා. ඒ තුන් දෙනාටම නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රී යූ.එල්.තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 40.** වක්වැල්ල, මොල්ලිගොඩ ක්‍රසන්ට් අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**41.** උක්වත්ත නැගෙනහිර, පරණවත්ත, අද්දර මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>**

**<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2020-12-22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2021-01-22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2021-01-22 දින පැවති තාක්ෂණික සේවා කමිටු වාර්තාව

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(උෟ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2020 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව සතු කලේගානේ දනට ඉදිකර ඇති ගොඩනැගිල්ලේ කැටයම් අළෙවි මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යාම සඳහා කොටසක් ලබා ගැනීම පිණිස. (ජාතික ශිල්ප සහා ඒකාබද්ධ බෝපෙ පෝද්දල ලී කැටයම්කරුවන්ගේ ශිල්ප සංවර්ධන සමිතිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපිට හම්බ වුණ ප්‍රතිපාදන වෙන් කරලා මේක සාදා නිම කරා. ඒක අපේ ශිල්ප සංවර්ධන සමිතියට මොනයම් ආකාරයකින් හරි, වාර්ෂික කුලී පදනමට හරි, කිසියම් සහනදායි ක්‍රමයකට ලබා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙහෙම කරන්න පුළුවන්. අපේ වැඩ අවසන් වුණාට පස්සේ සුළු තක්සේරු ගාස්තුවක් බලලා අපිත් සමග ගිවිසුම් ගත වෙලා ඒක ලබා දීමට කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජනවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, පොඩි ගැටළුවක් තියෙනවා. පහුගිය දවස්වල අපේ ගම්වලින් සංවර්ධන යෝජනා ගත්තා. එතකොට අපිට අපිට පොඩි ගැටළුවක් මතු වුණා. වෙන්දේසි ඉඩම් වල සංවර්ධන කටයුතු කරලා වසර පහක කාලසීමාව ඉක්මවා ගිහිල්ලද, නැද්ද කියලා නොදන්නාකමින් අපිට ඒ යෝජනා වලට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගන්න විදියකුත් නැහැ. මීට මාස දෙකකට කලිනුත් ඒකට ඉල්ලීමක් කරා. මේක ගැන දැනුම් දීම කරන්නම් කියලා ඔබතුමා කිවුවා. මොකද, ඊරියගස් දූව පාරේ පොඩි ගැටළුවක් තියෙනවා. ඒකෙ වෙන්දේසි ඉඩමක් කරා. ඒ පාර දැනට බොහොම අබලන් මට්ටමේ තියෙන්නේ. ඊළඟට සල්මල් උයන පාරේ ගැටළුව තියෙන්නේ.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගොඩක් කල් ඉඳලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවයේ තවම අවුරුදු පහ සම්පූර්ණ වෙලා නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙමනම් ඒ දැනුම් දීම කරලා ඒ පාරවල් සංවර්ධනය කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා යවලා තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තොටගොඩ සල්මල් උයන මාවත, ඒ පාරවල් ඔක්කොම විනාශ වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා ගැන දැනුම් දීම කරලා තියෙන්නේ. ඒ ටික බලා ගන්න පුළුවන්.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, තව එක කරුණක් ගැන දැන ගන්න තියෙනවා. තව වෙනතුරු අර කුරුන්ද කන්දේ සොහොන්පිටිය අත්පත් කර ගැනීම වෙනස් වෙලා නැහැ. ඒක ඒ විදියටම පරිහරණය වෙනවා. මාර්ගය අඩි 12 ක් විතර පළලට හොඳට හදලා තියෙනවා. ඇත්තටම මිනිස්සුන්ට ලොකු කලකිරීමක් තියෙනවා ඇයිද කියලා ප්‍රාදේශීය සභාවට මේ දේ කර ගන්න බැරි කියන එකට. මොකද හේතුව එක පුද්ගලයෙක් ඉන්නවා. ඒ පුද්ගලයාගේ තත්ත්වය උඩ තමයි මිනිස්සු ඒක තීරණය කරන්නේ. තව වෙනතුරු ඒක වෙනස් වුණේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නෙමෙයි ඒක තියෙන්නේ. ඒක අපේ ප්‍රාදේශීය සභාව සතු දේපලක්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ප්‍රාදේශීය සභාවට වැඩිය ලොකු හයියක් ඒ අයට තියෙනවා ඇති.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මොකක් හරි එහෙම ප්‍රශ්නයක් තියෙනවා කියලා මටත් හිතෙනවා. ඒක තව වෙනතුරු සිදු වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** කරාපිටිය බෝගහවෙල්ල පාරේ ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ කුණු දානවා. එතන බෝඩ් එකක් ගහන්න කුණු දාන්න එපා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඒකට බෝඩ් එකක් ගහන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා වී.සී. පාරේ කාණුවක් කැපුවා. ඒකෙ දැන් ජරා වතුර ගලා බහින්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර කපපු කාණුවට අප ජලය දානවා කියලා කතාවක් තියෙනවා. ඒක ලිඛිතව දන්වන්න අර කලින් කියපු ඒවත් එක්කම. ඒවාට අපි කිවුවනේ. එක දවසක් එහෙම දැම්මත් ඒකට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අර සොහොන්පිටියේ ප්‍රශ්නයට තව කරුණක් එකතු කරන්න කැමතියි. කාංචනා මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ කොට්ඨාශයේ ඉඳලා පිවිසෙන මාර්ගය ඒක. ඒක ඔබතුමියගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්. ඒක මගේ වසමත් එක්ක මායිම් වෙලා තියෙන්නේ. එතකොට ඒ සොහොන් පිටියට එක පුද්ගලයෙක් නිසා ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා. ඒක ඔබතුමිය දන්නවා. ඒකට ඔබතුමිය දරණ අදහස ගරු සභාවට ඉදිරිපත් කරොත් හොඳයි. එතකොට සිද්ධිය පැහැදිළි වෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මගේ ඒ ගැන කිසිදු විරෝධතාවයක් නැහැ. මොකද එතනින් වෙන හානිය පිළිබඳව මමත් ගොඩක් දැනුවත්. එතන ගැටළුව තිබුණේ ගමේ මිනිස්සුන්ට. ඒ වැට මායිමෙන් සුමිත් උප සභාපතිතුමාගේ කොට්ඨාශයයි, මගේ කොට්ඨාශයයි වෙන් වෙන නිසා සහ ගමේ මිනිස්සුන්ට එතනදී මේ වැඩේ නවත්වන්න ඕන නිසා මේක කාංචනා මන්ත්‍රීතුමියගේ කොට්ඨාශය, ගමට මන්ත්‍රීනි කෙනෙක් ඉන්නවා, සුමිත් උප සභාපතිතුමා මේ වැඩේට එන්න ඕන නැහැ කියලා තිබුණා. මම ඒකට කිසිසේත්ම එකග නැහැ, ඒ මිනිස්සු කියපු කතාවට. මන්ත්‍රීවරයෙක්, දේශපාලඥයෙක්, මහජන නියෝජිතයෙක් වුණාම වැරදි දේ වෙනුවෙන් පෙනී සිටින්න ඕන. ඒකෙදී කොට්ඨාශය කාගෙද, ප්‍රශ්නය මොකක්ද, මට ලකුණු වැටෙනවද කියන එක මට නම් කොහෙත්ම අදාළ නැහැ. මම නම් හිතන්නේ එතනදී මම කාන්තාවක් නිසා එක කකුලක් පොඩ්ඩක් පිටිපස්සට තියාගෙන ඉන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ බයටද.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** බය කියන්නේ ඒකට නෙමෙයි. මට එක කකුලක් පිටිපස්සට ගන්න වෙනවා. මොකද, මගේ පාක්ෂිකයෝ ඉන්න නිසා. ගැටුමක් ඇති වුණොත් හොඳ නැහැ. මම කැමති නැහැ කලහකාරි තත්ත්වයකට යන්න. මම උප සභාපතිතුමාට මගේ උපරිම සහයෝගය ලබා දෙනවා. වැරදි දේ වෙනුවෙන් කතා කරන්න මම කොයි වෙලාවකවත් බය නැහැ. එතුමාට මගේ උපරිම සහයෝගය ලබා දීලා එතුමා කරන දේ වෙනුවෙන් සහයෝගය ලබා දිය හැකි සියළුම දේ දීලා ඒක සාර්ථක කර ගන්න උදවු කරන්න කියලා මම සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බාධාවක් මුකුත් නැත්නම් ඒක ඉවර කරන්න. ඒක ඊළඟ සභාවට කතා කරන්න ඉඩ තියන්න එපා. ඉවර කරන්න ඕක.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** දැන් තියෙන්නේ වැඩේට බහින්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, වැලිකැටිය වත්ත මාර්ගයේ සහ කරාපිටිය අවට තියෙන පාලු ඉඩම් වලට කුණු බෑග් දාලා යනවා ගොඩක් තැන්වල. මම හිතන්නේ ඒකට අපිට සභාවෙන් බැරිද මොකක් හරි පියවරක් ගන්න බෝඩ් එකක් ගහලා හරි. වැලිකැටියවත්ත මාර්ගයේ දැන් පාර අයිනට දාලා තියෙනවා සෑහෙන්න කුණු බෑග් ප්‍රමාණයක්. පාර දිගේ දිගටම බල්ලෝ ඒවා ඇදලා ජරා වෙනවා.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඔබතුමන්ලා අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකෙදී ඔබතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා මේ නඩු භාර දෙන කොට ඇත්තටම මේ කමිටුවේ මන්ත්‍රීවරු ටික සහභාගි කර ගන්න කාටද, නඩුව භාර දෙන්නේ කියලා. හේතුව අපිට මේ ලේඛන ටික ගිහිල්ලා දීලා ඉවර වෙලා අහන්න පුළුවන් දැන් මේ නඩුව කරන්න පුළුවන්ද, බැරිද කියලා. ඒ නඩු භාර දෙන අයත් තීන්දු කර ගන්න කාටද දෙන්නේ කියලා. එහෙම නැතුව ගිහිල්ලා භාර දුන්නම මේ නඩු පරාද වෙන්න පුළුවන්. එහෙම දීලා වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කියපු අයට තමයි නඩු භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නීතිඥ ප්‍රසීත් වල්ගමට භාර දීලා තියෙනවා. ඒ භාර දීපු එකම මාසයකුත් පහුවෙලා ලියුම හදලා තියෙන කොට මමමනේ ඒක ගෙනල්ලා දුන්නේ. දැන් ඒක යනවා. මම කිවුවේ ඒක විතරක් නෙමෙයි. දැන් මේ ප්‍රශ්නයම මතු වෙලා ආවානේ ගරු සභාපතිතුමා ලීඩ්ස් එකෙන් පෙරේදා වෙන කොට. මම දැන් නීතිඥ විශ්වනාත් අරඹෙවෙල මහතාව සම්බන්ධ කර ගන්න උත්සාහ කරත් ඒක බැරි වුණා. දැන් ඒ අය හම්බවෙලා මිනිස්සු ලියුම් ඉදිරිපත් කරලා තියෙනවා දිගටම. එතන තියෙන්නේ ඉතාම භයානක තත්ත්වයක් හැම තැනටම වැඩිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පහුගිය දවසක එතනට ගිහිල්ලා කතා වෙලත් ආවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ලීඩ්ස් එකට ඇත්තටම නඩු දාලාද තියෙන්නේ,

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නඩු දාන්න භාර දීලා තියෙන්නේ. අපි ඒක වෙන වෙනම මැනලා භාර දුන්නා. එක නඩුවක් විදියට දාන්නේ. තාප්පයට වෙනම, අතනට වෙනම නෙමෙයි. අනවසර ඉදිකිරීම් සියල්ලම එකතු කරලා භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අපි මොකක්ද කියලා දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිඥ විශ්වනාත් අරඹෑවෙල මහතාට සම්පූර්ණයෙන්ම මේක භාර දීලා තියෙන්නේ. අදාළ මැනුම් එක්කම භාර දීලා තියෙන්නේ අනවසර ඉදිකිරීම් මෙච්චරයි, මෙච්චරයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට දින වකවාණු ඇතුව කවදද නඩුව ඇතුළත් කරන්නේ කියලා දැන ගන්න අපි නීතිඥ විශ්වනාත් අරඹෑවෙල මහතාව හම්බවෙලා ඒක ගැන කතා කර ගමු. ඊළඟට සභාපතිතුමා ඒ ඉස්කෝලේ ළමයි ඉන්නේ අනතුරක. ඔබතුමා ගියා නම් දකින්න ඇතිනේ පැහැදිළිවම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ උඩ තියෙන කෝටි ගණන් වියදම් කරලා හදපු ගෙවල් අනතුරේ තියෙන්නේ. කණ්ඩිය අඩි එකසිය පනහක් විතර කපලා. අර අතන සදරින් කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය කරන එකට වැඩිය දරණු බැම්මක් එතන තියෙන්නේ. යට සම්පූර්ණයෙන්ම හැරිලා තියෙන්නේ. පාරේ යටට ගිහිල්ලා තියෙන්නේ. ඔබතුමා උඩට ගියේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම උඩ පැත්තට ගියේ නැහැ. යට පැත්තට විතරයි ගියේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කියන්නේ පාර උඩ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන අඩි පහක රක්ෂිතයක් තියෙනවා. කොහොම හරි ඒ රක්ෂිතයේ අඩියක්වත් දැන් හොයා ගන්න නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම අඩියක්වත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කණ්ඩිය කැපුවේ නැති වුණාට බැම්ම ස්ථාවර කිරීමේ වගකීම ඒ අයට තියෙනවානේ. නමුත් ඒ අය ඉඩම ගන්නේ ඕවා අඩු කරලනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා එන්.බී.ආර්.ඕ. එක දැන් මෙතන පස් කපන්න අනුමැතිය දීලා තියෙන්නේ කොහොමද, ඒ අයගෙන් සැලැස්මක් ඉල්ල ගන්න ඕන කොහොමද ඒකෙ ඉදිරි වැඩ කටයුතු කරේ කියලා.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නම් බරපතල ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කොයිවෙලාවක හරි කඩා ගෙන යනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ ගේත් කඩාගෙන යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා මේ අදාළ ප්‍රදේශවල නිලධාරීන් ටිකට මේක භාර ගන්න කියන්න අවුරුදු පහ සම්පූර්ණ වෙන්න කලින්. අන්තිම මොහොතේ මේක ගැන දිගින් දිගටම කියනවා. දැන් තව ටික දවසයි තියෙන්නේ ග්‍රෑන්ඩ් පැනරෝමා එකේ අවුරුදු පහ පනින්න. ඒක හින්දා දෙවැනි අදියරේදී ඕක වහාම දාන්න.

ඊළඟට දැන් දෙවැනි අදියරේ බිම් කොටස් ටික විකුණන්න දාලා තියෙනවා. දැන් ආයේම බෝඩ් ටික දාලා තියෙනවා. ඔබතුමා ඒකට ගිහිල්ලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට උදෘත තුනක් මෙහෙට භාර දීලා තියෙනවා ඒ අය අනුමැතිය සඳහා. පාර හදනකම් ඒකට අනුමැතිය නොදී තියාගෙන ඉන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි. ඊළඟට දැන් මේ වටරැක වෙන්දේසි ඉඩම කපපු නිසා තමයි පාර කඩාගෙන ගිහිල්ලා තියෙන්නේ. සුගත් මන්ත්‍රීතුමා ඒක ගැන කතා කරාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ ඇයි තවම බෝක්කු දාලා නැත්තේ ප්‍රධාන පාරට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සුපිරි වෙළඳසැල ගාව ගොඩනැගිල්ලේ ප්‍රශ්නය ගැන අපි නීතිඥ මහතා සමග කතා කරන්න ඕන. ඊළඟට ගරු සභාපතිතුමනි, දිගින් දිගටම මේ අපරාධය වුණේ, ඒ මිනිස්සුන්ට මේ අපරාධය කරේ මේ නිලධාරීන්. මම පැහැදිළිවම ඒක කියනවා. දැන් අර තට්ටු තුනේ ගේ පිළිබඳව බලන්න. දැන් එදා ඉඳලා, 2016, 2017 ඉඳන් මේක ගැන කතා කරනවා. අද වෙනකම් ඒකට ගනිපු ක්‍රියාමාර්ගයක් නැහැ. දැන් ඉන්න නිලධාරීන් නෙමෙයි ඉස්සෙල්ලා ඉන්න නිලධාරීන් ඒක බලන්න ඕන. නමුත් දැන් අදත් ඒකට ගනිපු ක්‍රියාමාර්ගයක් නැහැ. දැන් මේකට හැම සභාවකදීම මම කතා කරනවා. දැන්

මේක තේරුමක් නැහැ. මේ ටිකම තමයි මම ඔබතුමන්ලාට නිතර නිතර කිවුවේ. දැන් තුන්වෙනිදා ආවම එන්.බී.ආර්.ඕ. එකෙන් එන අයත් එක්ක මේක බලන්න යන්න ඕන. කොහොමද මේවට කපන්න කොටන්න අවසර දෙන්නේ කියන එක අපි අහන්න ඕන. කොහොම හරි ඒක මේ අයගෙන් අහගන්න ඕන. ඊළඟට එකක් තියෙනවා දැන් ඒ අය ගැන මම දන්නවා. අවසානයේ පටවනවා බොහොම පැහැදිලිව වැරැද්ද සභාවට. ඉතාම පැහැදිලිව තියෙන එකක් තමයි සභාවේ නිලධාරීන් විසින් ඒවා අධීක්ෂණය කළ යුතුය.

ඊළඟට සභාපතිතුමා පැතුම් උයන ගැන බැලුවම දැන් අපි කියපු ඒවා වෙලා තියෙනවානේ. දැන් මේ අය කරන වෙනත් කිසිම තැනකට අවසර දෙන්න යන්න එපා මේවා නිවැරදි කරනකම්. බලන්න නිකං සිමෙන්ති අලවාගෙන ගිහිල්ලානේ තියෙන්නේ. ඔබතුමා ඒක බලන්න ගියාද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ළඟකදී නම් ගියේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** යන්නකෝ ටිකක් ඒක බලන්න. වෙන ගමනක් යන කොට හරි ඒකට ගොඩවෙලා බලන්නකෝ. ඔක්කොම පාර කැඩිලා තියෙන්නේ. මිනිස්සුන්ට යන්න බැහැ දැන් ඒ පාරේ. එතනට පෙට්ටි බෝක්කුවක් දාන්නේ නැත්නම් වැඩක් නැහැ. ඒක කෙරෙන්නේ නැති නිසා වතුර බහින්නේ නැහැ. කාණුව දෙපැත්තට දාන්න ඕන. පාර පැත්තේ විතරක් සිමෙන්ති අලවා ගෙන ගිහිල්ලා තියෙනවා. එක යකඩ කම්බියක් ඒකට දාලා නැහැ.

මේ පාසල ඇත්තටම පවත්වා ගෙන යන්න රජයෙන් ක්ලියරන්ස් ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොන පාසලද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ලීඩ්ස් ඉන්ටර්නැෂනල් එක. බොහොම පැහැදිලිව තියෙනවා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අවසර ගත්තේ නැහැ කියන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒකට අබේසේකර මන්ත්‍රීතුමා කිසි ප්‍රශ්නයක් නැහැ. නඩුව භාර දීලා තියෙන්නේ. ඒක බලලා ඕන විදියකට කරන්න කිසි ගැටළුවක් නැහැ.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-02-16 වන අඟහරුවාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.